සැ. යු.- 2012.09.28 දින පළවූ අංක 1778 දරන ගැසට් පත්‍රයේ IV(අ) කොටස පළ නොවීය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 1,779 - 2012 ඔක්තෝබර් මස 05 වැනි සිකුරාදා - 2012.10.05

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස : (IIඅ) වැනි ඡෙදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)

| | පිටුව | | පිටුව |
|---|---|---|---|
| තනතුරු - ඇබෑර්තු ... ... ... ... | 1454 | විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | 1461 |

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. **නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.**

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2012 ඔක්තෝබර් මස 25 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2012 ඔක්තෝබර් මස 12 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**බී. කේ. එස්. රවීන්ද්‍ර,**
රජයේ මුද්‍රණාලයාධිපති. (*වැ. බ.*)

2012 ජුනි මස 23 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

1451 - B 80652 — 9400 (2012/10)
B1-

## ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන රාජ්‍ය සේවා පත් කිරීම්වලට අදාළ වන පොදු කොන්දේසි

**අවශ්‍ය සාමාන්‍ය සුදුසුකම් :**

1.1 තමා ශ්‍රී ලාංකිකයෙකු බවට ප්‍රමාණවත් සාක්ෂි සෑම අයදුම්කරුවකු විසින් ම ඉදිරිපත් කළ යුතුය.

ශ්‍රී ලාංකික යනුවෙන් අදහස් කෙරෙනුයේ ලංකා පුරවැසි පනතේ අර්ථ දක්වා ඇති පරිදි පාරම්පරික වශයෙන් හෝ ලියාපදිංචි කරවා ගැනීමෙන් හෝ ශ්‍රී ලංකාවේ පුරවැසිකම් ලැබූවෙකි.

1.2 ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන හෝ ඊට වඩා උසස් විභාගයකින් සමත් වී තිබීම අවම අධ්‍යාපනික සුදුසුකමක් වශයෙන් නියම කොට ඇති යම් තනතුරක් සඳහා ඉල්ලුම් කරන අයදුම්කරුවෙකු සිංහල හෝ දෙමළ හෝ මාධ්‍යයෙන් අධ්‍යාපනය ලැබූ අයෙකු වේ නම්, ඔහු ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන විභාගයකින් හෝ සිංහල හෝ දෙමළ හෝ භාෂාව විෂයයෙන් අවස්ථාවෝචිත පරිදි සමත් වී සිටිය යුතු ය. (1961 ජනවාරි මස 01 වැනි දිනට පෙර දිනක සිට රාජ්‍ය සේවයෙහි යෙදී සිටින්නාවූත් රාජ්‍ය සේවයෙහි වෙනත් තනතුරුවලට ඉල්ලුම් කරන්නාවූත් නිලධාරීන් විෂයයෙහි මෙම නියමය අදාළ නොවන්නේ ය.)

*1.3 අයදුම් කරනු ලබන තනතුර සඳහා නියමිත ඉහළම රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණවලින් නිදහස් කිරීමට හිමිකම් ලබන සුදුසුකම් පසු කලක දී ලබා තිබේ නම් මිස, නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණය සමත්වීමට අපොහොසත්වීම නිසා පරිවාස/පරීක්ෂණ කාලයකට යටත්ව දෙන ලද සිය පත්වීම අවසන් කරනු ලැබූ, සිංහල හෝ දෙමළ හෝ නොවන භාෂා මාධ්‍යයකින් රජයේ සේවයට ඇතුළත්ව සිටි නව ප්‍රවේශක නිලධාරීන්ගෙන් ලැබෙන අයදුම්පත් භාරගනු නොලැබේ.

**2. සේවා කොන්දේසි - සාමාන්‍ය :**

2.1 රාජ්‍ය සේවයෙහි යෙදී සිටින සියලු ම නිලධාරීහු මුදල් රෙගුලාසි, ආයතන සංග්‍රහය, දෙපාර්තමේන්තු නියෝග හෝ රෙගුලාසි සහ රජය විසින් වරින් වර නිකුත් කරනු ලැබිය හැකි වෙනත් නියෝග හෝ රෙගුලාසිවලට යටත් විය යුත්තා හ.

2.2 අදාළ අමාත්‍යාංශයෙහි ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි ප්‍රමාණයේ මුදලක් එම ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි අන්දමකින් ඇප තබන ලද රාජ්‍ය සේවා නිලධාරීන්ගේ (ඇප) ආඥාපනත යටතේ රාජ්‍ය නිලධාරියකුට නියම කරනු ලැබිය හැකි ය.

2.3 දිවයිනේ ඕනෑ ම තැනක සේවය කිරීමට රාජ්‍ය නිලධාරියෙකුට නියම කරනු ලැබිය හැකිය.

**3. ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරීන්ට අදාළ සේවා කොන්දේසි**

3.1 ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරීහු පූර්වෝක්ත 2 වැනි වගන්තියේ සඳහන් කොන්දේසිවලට අතිරේක වශයෙන් පහත දැක්වෙන අතිකුත් කොන්දේසිවලට ද යටත් විය යුතුය.

3.1.1 යම්කිසි තනතුරක පරිවාස කාලය අවුරුදු තුනකට වැඩි විය යුතු යැයි සලකනු ලබන්නේ නම් විනා එසේ නොමැති නම් සියලු ම පත් කිරීම් අවුරුදු තුනක පරිවාස කාලයකට යටත් වනු ඇත. පරිවාස කාලය තුළ හේතුවක් නොදක්වා සේවය නතර කරනු ලැබිය හැකිය.

3.1.2 සියලු ම රාජ්‍ය නිලධාරීහු රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියෙහි අවශ්‍යතාවයන් සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ IV වන පරිච්ඡේදයේ විධිවිධාන සහ රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා දැනට පවත්නා වූ සහ මින් මතු පනවනු ලබන්නාවූ අනෙකුත් නීති, රෙගුලාසි සහ ව්‍යවස්ථා ද පිළිපැදිය යුත්තාහ.

3.1.3 රාජ්‍ය භාෂාවකින් වැඩ කිරීමට හැකිවන අන්දමේ දැනුමක් තමන්ගේ පරිවාස කාලය ඇතුළත ලබාගන්නා ලෙස සිංහල හෝ දෙමළ නොවන භාෂා මාධ්‍යයකින් රාජ්‍ය සේවයට ඇතුළත් වූ නිලධාරීන්ට නියම කෙරේ.

3.1.4 සිංහල හෝ දෙමළ හෝ නොවන වෙනත් භාෂා මාධ්‍යයකින් සේවයට ඇතුළත් වූ නිලධාරියෙකු පරිවාස කාලය අවසානයේ දී තනතුරෙහි ස්ථිර කරනු ලැබීමට අදාළ වන වෙනත් කරුණු අතර, අවුරුද්දක් ඇතුළත කවර හෝ රාජ්‍ය භාෂාවකින් නියමිත ප්‍රවීණතා පරීක්ෂණයෙහි I වැනි ශ්‍රේණියෙන් සමත්වීමත්, අවුරුදු දෙකක් ඇතුළත II වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් (අවශ්‍යනම්) අවුරුදු තුනක් ඇතුළත III වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් බලපවත්වනු ඇත.

නියමිත කාල සීමා ඇතුළත දී පරීක්ෂණයකින් අසමත් වුවහොත් වැටුප් වර්ධකයක් තාවකාලිකව අත්හිටුවනු ලැබිය හැකි ය. නියමිත කාලසීමාව ඉක්මවා තව මාස හයක කාලසීමාවක් ඇතුළත යථෝක්ත පරීක්ෂණයෙන් සමත්වීමට අසමත් වුවහොත් එසේ වැටුප් වර්ධක තාවකාලිකව අත්හිටුවීම, වැටුප් වර්ධක නතර කිරීමකට පරිවර්තනය කෙරෙනු ඇත. පරීක්ෂණයෙන් සමත්වන තෙක් හෝ පහත දැක්වෙන 3.1.6 වැනි වගන්තියේ විධිවිධානයන් බලපවත්වන තෙක් හෝ යථෝක්ත වැටුප් වර්ධකයන් නතර කිරීම ක්‍රියාත්මක වන්නේය.

3.1.5 මෙවැනි නිලධාරීන්ට පත්වීම ලැබීමෙන් පසු රාජ්‍ය භාෂාවක ප්‍රවීණතාවය ලබා ගැනීම පිණිස මාස හයක කාලයක් සඳහා පූර්ණ වැටුප් සහිත පහසුකම් සැලසිය යුතුය. ඉන් අනතුරුව අදාළ ප්‍රවීණතා විභාගයට ඔහු පෙනී සිටිය යුතු අතර, එම විභාගයෙන් අසමත් වුවහොත් පූර්ණ වැටුප් සහිත මාස හයක කාල පරිච්ඡේදයෙන් පසු ඒ සමඟම එළඹෙන අවුරුදු දෙකක කාල පරිච්ඡේදය තුළ තමාගේ සාමාන්‍ය රාජකාරිවල නිරත වෙමින් සිටිය දී විභාගයෙන් සමත්වීමට ඔහුට අවස්ථාව සලසා දෙනු ලැබේ.

3.1.6 නියමිත අවුරුදු දෙකහමාරක කාල පරිච්ඡේදය තුළ විභාගයෙන් සමත්වීමට නොහැකි වුවහොත් ඔහුගේ සේවය අවසන් කරනු ලැබේ.

3.1.7 රාජ්‍ය සේවයෙහි ස්ථිර තනතුරක දැනටමත් ස්ථිර කරනු ලැබ සිටින රාජ්‍ය නිලධාරියෙකු රාජ්‍ය සේවයෙහි වෙනත් ස්ථිර තනතුරකට පත් කරනු ලැබූ විට යළි පරිවාස කාලසීමාවක් සේවය කරන ලෙස සාමාන්‍යයෙන් ඔහුට නියම කරනු නොලැබේ. එවැනි නිලධාරියෙකු සිය නව තනතුරෙහි කරන සේවය පරීක්ෂා කර බැලීම සඳහා ප්‍රථමයෙන් එම තනතුරෙහි නියමිත කාලසීමාවක් වැඩ බැලීම සඳහා ඔහු පත් කරනු ලැබිය හැකි ය.

3.1.8 (රාජ්‍ය සේවයෙහි දැනටමත් ස්ථිර/තාවකාලික තනතුරු දරන්නා වූ ද වෛද්‍ය පරීක්ෂණයකට භාජනය කරනු ලැබුවා වූ ද, අය හැර) තෝරාගනු ලැබූ අපේක්ෂකයන් දිවයිනේ ඕනෑම පෙදෙසක සේවය කිරීමට ශාරීරිකව සුදුසුද නැද්ද යනු පරීක්ෂා කිරීම පිණිස රජයේ වෛද්‍ය නිලධාරියෙකු විසින් පවත්වනු ලබන වෛද්‍ය පරීක්ෂණයකට ඉදිරිපත්වන ලෙස ඔවුනට නියම කරනු ඇත.

**4. සේවයට භාර ගැනීම පිළිබඳ කොන්දේසි**

4.1 ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට පත් කරනු ලබන රාජ්‍ය නිලධාරීන් විසින් ඔවුන්ගේ වැටුපෙන් අයකර ගතයුතු යැයි රජය විසින් නියම කරනු ලබන ප්‍රතිශතයක ප්‍රමාණයට සමාන මුදලක් ස්වකීය වැටුපෙන් වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් වශයෙන් ගෙවිය යුතුය.

4.2 අර්ථසාධක අරමුදල් පදනම මත ස්ථිර හෝ තාවකාලික තනතුරුවලට පත්කරනු ලැබූ රාජ්‍ය නිලධාරීන් ස්වකීය ඒකාබද්ධ වැටුපෙන් 6%ක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට දායක මුදල් වශයෙන් ගෙවිය යුතු වන්නේ ය. මුදල් වර්ෂය අවසානයේ දී අනිවාර්ය දායක මුදල් වශයෙන් අරමුදලට බැරකර ඇති මුදල් ප්‍රමාණය මෙන් 150%ක මුදල් ප්‍රමාණයක් රජය විසින් එම අරමුදලට රජයේ දායක මුදල වශයෙන් ගෙවනු ඇත.

4.3 පළාත් පාලන සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලබන රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරු උසුලන්නා වූ නිලධාරීන් සහ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබ පළාත් පාලන සේවයේ (විශ්‍රාම වැටුප් සහිත) තනතුරු උසුලන්නා වූ නිලධාරීන්හට පිළිවෙලින් ඔවුන්ගේ පළාත් පාලන සේවයේ සහ රාජ්‍ය සේවයේ තනතුරු සහ විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ.

4.4 විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය යටතේ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබූ යුද, නාවික සහ ගුවන් හමුදාවේ නිත්‍ය සේවයෙහි නියුතු පිරිසට ඔවුන්ගේ රාජ්‍ය සේවයෙහි තනතුරු සඳහා විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ. මෙම ව්‍යවස්ථා සංග්‍රහය යටතේ විශ්‍රාම වැටුප් සහිත බවට ප්‍රකාශිත තනතුරක රාජ්‍ය නිලධාරියෙක් ලෙස පත්වීමක් භාර ගැනීම සඳහා මුදා හරිණු ලැබූ සන්නද්ධ හමුදාවක යම් සාමාජිකයෙකුගේ සම්පූර්ණ වැටුප් සහිත අහිමි නොවූ සේවා කාලසීමාව මේ ව්‍යවස්ථා සංග්‍රහයේ පටහැනිව කුමක් සඳහන්ව තිබුණ ද, මේ ව්‍යවස්ථා සංග්‍රහය යටතේ ගෙවිය යුතු යම් විශ්‍රාම වැටුප් පාරිතෝෂිකයක කාර්යය සඳහා ගණන් ගත යුතු ය.

**5. යුද්ධ සේවා අනුග්‍රහය**

5.1 එක්සත් රාජ්‍ය යුද්ධාවතීරණ හමුදාවන්හි සේවා මුක්ත භටයින් ද, සහාය ගිනි නිවන, ගගන ප්‍රහාර නිවාරණ සහ මහජන ආරක්ෂක සේවාවන්හි පූර්ණකාලීන සාමාජිකයන් වශයෙන් නියුක්තව සිටි තමන්ගේම ඕනෑකමින් එම සේවාවන්ගෙන් අස්ව නොගිය අයට ද ඉහත කී සියලු සුදුසුකම් තිබේ නම් ද ඔවුන් මෙම හමුදාවන්ට බැඳී ඇත්තේ 1954 අගෝස්තු මස 15 වැනි දිනට පෙරාතුව නම් ද, ඔවුන්ගේ එම සේවාවන් සතුටුදායක ලෙස සහ අඛණ්ඩව පැවතිණි නම් ද, වයස අතින් සුදුසුකම් ලබා ගැනීම සඳහා ඔවුන්ට තමන්ගේ වයස්වලින් 1939 සැප්තැම්බර් මස 03 වැනි දින සිට 1949 දෙසැම්බර් මස 31 වැනි දින දක්වා වූ කාලසීමාව තුළ තම තමන් සේවය කළ කාලයන් අඩුකර ගැනීමට ඉඩදෙනු ලැබේ.

**6. රාජ්‍ය සේවයෙහි දැනට සේවය කරන නිලධාරීහු**

6.1 රාජ්‍ය සේවයෙහි දැනට සේවයෙහි යෙදී සිටින්නාවූත්, අවශ්‍ය සියලු සුදුසුකම් ඇත්තාවූත්, නිලධාරීන් විසින් ඉදිරිපත් කරන අයදුම්පත් ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් එවිය යුතුය. නව තනතුරු සඳහා ඉල්ලුම් කරන්නා වූ ද, රාජ්‍ය සේවයෙහි දැනට ස්ථිර තනතුරු දරන්නා වූ ද, නිලධාරීන්ගෙන් යමෙකු නව තනතුරකට තෝරාගනු ලැබුවහොත් ඒ සඳහා ඔවුන් මුදවාලිය හැකි ද නොහැකි ද යන්න එම නිලධාරීන් සේවයෙහි යෙදී සිටින දෙපාර්තමේන්තුවල ප්‍රධානීන් විසින් ඔවුන්ගේ අයදුම්පත් ඉදිරිපත් කරන විට සඳහන් කළ යුතු ය.

6.2 නියමිත වේලාවක නියමිත ස්ථානයක දී සම්මුඛ පරීක්ෂණයක් සඳහා පෙනී සිටින ලෙස අයදුම්කරුවන්ට නියම කරනු ලැබිය හැක. මේ සම්බන්ධයෙන් දැරීමට සිදුවන ගමන් වියදම් හෝ වෙනත් වියදම් ආදියත් ගෙවනු නොලැබේ.

6.3 යම්කිසි අයදුම්කරුවකු නිර්දේශ කිරීමට අදහස් කරන කෙනෙකු විසින් අයදුම්කරුට චරිත සහතිකයක් දීමෙන් එසේ කළ යුතු ය. යම් අයදුම්කරුවකු තෝරා ගන්නා පරිද්දෙන් කවර අන්දමේ වුව ද අයථා අනුග්‍රහයන් පැතීම හෝ එහිලා යම් බලපෑමක් කිරීමට තැත් කිරීම හෝ එම අයදුම්කරු නුසුදුස්සකු කරනු ලැබීමට හේතුවනු ඇත.

6.4 අයදුම්කරුගේ අයදුම්පතෙහි කිසියම් සාවද්‍ය ප්‍රකාශයක් තිබෙන බැව් ඔහු තෝරා ගැනීමට කලින් දැන ගන්නට ලැබුණි නම් ඒ හේතුවෙන් ඔහු එම තනතුරට නුසුදුස්සකු බවට පත් කරනු ලැබීමටත්, තෝරා ගැනීමෙන් පසු ඒ බව අනාවරණය වුණි නම් ඔහු රාජකාරියෙන් පහකරනු ලැබීමටත් ඉඩ තිබේ.

6.5 මෙම දැන්වීමෙහි සඳහන් වන නියමයන්ට සෑම අතින් ම අනුකූල නොවන අන්දමේ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**7. සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප් යන්නෙහි අර්ථ දැක්වීම**

7.1 සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප යන්නෙන් අදහස් කෙරෙනුයේ ඒකාබද්ධ වැටුප පමණකි. වැඩ බැලීමේ වැටුපක් හෝ දීමනා ආදිය ඊට ඇතුළත් නොවන්නේ ය.

**8. බඳවා ගැනීම සහ උසස් කිරීම සම්බන්ධ නව ජාතික ප්‍රතිපත්තිය**

පසුව නිකුත් කෙරෙන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ මගින් සංශෝධනය කිරීමට යටත්ව 1990.08.09 දිනැති අංක 15/90, 1990.03.05 දිනැති අංක 15/90(I) සහ 1990.06.15 දිනැති අංක 15/90 (II) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛවල දක්වා ඇති ප්‍රතිපත්තියට අනුකූලව රාජ්‍ය සේවයට, පළාත් රාජ්‍ය සේවයට, රාජ්‍ය සංස්ථා අංශයට සහ රජයට සම්පූර්ණයෙන්ම අයත් සමාගම්වලට බඳවා ගැනීම සහ

# විභාග අපේක්ෂකයන් සඳහා නීති සහ උපදෙස්

"1968 අංක 25 දරන විභාග පනතේ දක්වා ඇති විධිවිධානයන්ට අනුකූලව කටයුතු කිරීමට සියලුම විභාගාපේක්ෂකයින් බැඳී ඇත"

සියලු ම විභාගාපේක්ෂකයින් පහත සඳහන් නීති පිළිපැදීමට බැඳී සිටිය යුතුය. මේ නීති කිසිවක් උල්ලංඝනය කරන විභාගාපේක්ෂකයෙකුට විභාග කොමසාරිස්ගේ අභිමතය පරිදි පහත සඳහන් දඬුවම් එකක් හෝ ඊට වැඩි ගණනක් හෝ පමුණුවනු ලැබිය හැකිය :-

(i) මුළු විභාගයටම හෝ ඉන් කොටසකට හෝ නැතහොත් එක් විෂයයකට හෝ ඉන් කොටසකට පෙනී සිටීම හෝ තහනම් කිරීම,
(ii) විභාගයේ එක් විෂයයකට හෝ මුළු විභාගයටම හෝ නුසුදුස්සෙකු කිරීම,
(iii) එක් අවුරුද්දකට හෝ අවුරුදු දෙකකට හෝ කිසිම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම,
(iv) මුළු ජීවිත කාලයේ ම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම,
(v) සහතික පත්‍රය යම්කිසි කාල සීමාවක් තුළ තහනම් කිරීම,
(vi) විභාගාපේක්ෂකයාගේ ක්‍රියා පරිපාටිය සම්බන්ධයෙන් ඔහු ගැන වගකිවයුත්තන්ට සැලකර සිටීම හෝ විභාගාපේක්ෂකයා පොලීසියට භාරදීම හෝ ඔහුගේ ක්‍රියාව සම්බන්ධයෙන් පොලීසියට පැමිණිලි කිරීම.

විභාගයට කලින් හෝ විභාගය පවත්වාගෙන යන අතරතුර හෝ විභාගයට පසුව හෝ කොයිම අවස්ථාවකදී වුවත් එවැනි විභාගාපේක්ෂකයෙකු සම්බන්ධයෙන් ක්‍රියා කිරීමේ බලය විභාග කොමසාරිස් සතු වේ. ඒ සම්බන්ධයෙන් ඔහුගේ තීරණය අවසාන තීරණය වන්නේ ය. එහෙත් රජයේ සේවකයන් බඳවා ගැනීම සඳහා පවත්වනු ලබන විභාග පිළිබඳ ව විභාග කොමසාරිස්ගේ තීරණය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සමීක්ෂණයට යටත් වන්නේ ය.

1. සියලු ම විභාගාපේක්ෂකයන් විභාග ශාලාව තුළදීත් ඒ අසලදීත් විභාග ශාලාධිපතීන්ට ද, ඔහුගේ සහකාරයින්ට ද, අනිකුත් විභාගාපේක්ෂකයින්ට ද බාධාවක් හෝ අවහිරයක් හෝ ඇති නොවන ලෙස ශාන්තදාන්තව හැසිරිය යුතුය. විභාග ශාලාවට ඇතුළු වන විටත්, ඉන් පිටවන විටත් ඉතා සන්සුන් ලීලාවෙන් හැසිරිය යුතුය.

2. විභාගාපේක්ෂකයෝ විභාග ශාලාධිපතීන්ට කීකරු විය යුත්තාහ. එබැවින් ඔවුන් විභාගය පවත්වාගෙන යන අතරතුරත්, විභාගය පටන් ගැනීමට පෙරත්, විභාගය අවසන් වූ විගසත් විභාග ශාලාධිපතීන්ගේ හා ඔහුගේ සහකාරයන්ගේ උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය.

3. විභාගයේ දී ප්‍රශ්න පත්‍රයකට උත්තර ලිවීම පටන්ගෙන පැය භාගයක් ගතවූවාට පසු මොනම කාරණයක් නිසාවත් විභාගාපේක්ෂකයෙකු විභාග ශාලාවට ඇතුළු කරගනු නොලැබේ. විභාගය පටන් ගෙන පැය භාගයක් ගතවන තුරු ප්‍රශ්න පත්‍රයට පෙනී සිටින අපේක්ෂකයෙකුට විභාග ශාලාවෙන් පිටවී යාම තහනම්ය. ප්‍රායෝගික පරීක්ෂණවලට හෝ වාචික පරීක්ෂණවලට පමා වී පැමිණෙන අපේක්ෂකයන් විභාග ශාලාවට ඇතුළු නොකිරීමට ඉඩ තිබේ.

4. සෑම විභාගාපේක්ෂකයෙකුම තමාගේ විභාග අංකය දරන ආසනයේ හැර වෙන කිසිම තැනක වාඩි නොවිය යුතුය. විභාග ශාලාධිපතිගේ විශේෂ අවසරය නොමැතිව තමන්ගේ ස්ථානය වෙනස් නොකළ යුතුයි. තමන්ට නියම නොකරන ලද අසුනක් ගැනීම වංචනික අදහසින් කරන ලද ක්‍රියාවක් වශයෙන් සලකනු ලැබීමට සිදුවේ.

5. විභාග ශාලාව තුළ සම්පූර්ණයෙන් ම නිශ්ශබ්ද ව සිටිය යුතු ය. මොන ම කාරණයක් නිසාවත් විභාග ශාලාව ඇතුළත දී විභාග ශාලාවේ කාර්ය මණ්ඩලයේ කෙනෙකු සමග හැර, විභාග ශාලාව ඇතුළත හෝ පිටත හෝ සිටින කිසිවකු සමග මොනයම් කරුණක් නිසාවත් කතාබස් කිරීම හෝ පණිවුඩ හුවමාරු කර ගැනීම හෝ වෙනත් අන්දමේ ගනුදෙනු කිරීම හෝ සම්පූර්ණයෙන්ම තහනම්ය. යම් කිසි හදිසි වුවමනාවක් සඳහා කිසිවෙකු සමග කතාබස් කිරීමක් අවශ්‍ය වුවහොත් ප්‍රථමයෙන් ඒ සඳහා විභාග ශාලාධිපතින්ගේ අවසරය ලබා ගත යුතු යි.

6. විභාගාපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රය හඳුනාගනු ලබන්නේ ඔහුගේ විභාග අංකයෙන් පමණක් හෙයින් උත්තර පත්‍රවල තමන්ගේ නම නොලිවිය යුතුයි. තමාගේ උත්තර පත්‍රයෙහි අන්‍ය විභාගාපේක්ෂකයෙකුගේ විභාග අංකය ලිවීම වංචනික ක්‍රියාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් ලෙස සලකනු ලැබේ. හඳුනාගත නොහැකි පරිදි විභාග අංකය ලියා ඇති උත්තර පත්‍ර ප්‍රතික්ෂේප කිරීමට ද සිදුවෙනවා ඇත.

7. තමන් වෙත සපයන ලද කඩදාසි හැර තීන්ත පොවන කඩදාසියෙහි හෝ ප්‍රශ්න පත්‍රයෙහි හෝ මේසය මත හෝ වෙන කිසි තැනක හෝ කිසිවක් නොලිවිය යුතුය. මේ නීතිය නොසැලකීම වංචනික චේතනාවකින් යුක්තව ක්‍රියා කිරීමක් ලෙස සැලකිය හැකි වේ.

8. තමන් වෙත සපයන ලද කඩදාසියක් හෝ උත්තර ලියන පොතක් හෝ ඉරාදැමීම හෝ පොඩි කිරීම හෝ නමා දැමීම හෝ අකාමකා දැමීම හෝ නොකළ යුතුය. කටුවැඩ ආදිය සඳහා පාවිච්චි කරන ලද සෑම කඩදාසියක්ම උත්තර පත්‍රයට ඇමිණිය යුතු ය. ඒවා උත්තර පත්‍රයෙහිම කොටසක් විය යුතු ය. එබඳු කටුවැඩ පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. විභාග ශාලාවේ දී ලියන ලද කිසිම දෙයක් ඉන් පිටත ගෙනයෑම තහනම් ය. එකම ප්‍රශ්නයකට පිළිතුරු දෙතැනක ලියැවී තිබේ නම් අනවශ්‍ය පිළිතුරු පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. මේ කරුණු පැහැර හැරීම වංචාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් සේ සැළකීමට ඉඩ තිබේ.

9. ගණිත ප්‍රශ්නවල දී ගණන් වරදවා සාදා හෝ ගණනක් කොහෙත්ම නොසාදා හෝ නිවැරදි පිළිතුරු දැක්වීමත් චිත්‍ර කර්මයේ දී තමන්ගේ චිත්‍රය තවත් අපේක්ෂකයෙකුගේ චිත්‍රයට ආකල්ප මාත්‍රයෙන් හෝ ස්වරූපයෙන් හෝ ක්‍රියාකාරිත්වයෙන් හෝ යනාදියකින් සමානව, එසේ නැතිනම් බොහෝ සෙයින්ම කිට්ටුවම තිබීමත්, වංචා සහගත ක්‍රියාවක් සේ සලකනු ලැබීමට හේතු විය හැකිය.

10. විභාගයේ දී උත්තර ලිවීම සඳහා තමන්ට සපයනු ලබන කඩදාසි හෝ වෙනත් ද්‍රව්‍ය විභාග ශාලාවෙන් පිටතට ගෙනයාම තහනම්ය. මේ සියලුම දෑ විභාග කොමසාරිස් සතුය. මේ නීතිය කඩකිරීම වංචනික චේතනාවකින් යුත් ක්‍රියාවක් ලෙස සැලකීමට හේතු විය හැකිය.

11. තමන් වෙත සපයන ලද ලිපිද්‍රව්‍ය හැර වෙනත් පොත්පත්, සටහන් පොත්, සාක්කුවේ පාවිච්චි කරන නෝට් පොත්, ඇක්සයිස් පොත් හා කඩදාසි කොළ හෝ කැබලි ද, තමන්ගේ පාට පෙට්ටි හා පාර්සල් ආදිය ද, පයිල් කවර, කාඩ්බෝඩ් පෑඩ්, නැවූ ප්‍රවෘත්ති පත්‍ර, බ්‍රවුන් පේපර් යනාදිය ද, විභාග ශාලාව තුළ සිටින කිසි විටෙක තමා වෙත හෝ සමීපයෙහි හෝ තබා නොගත යුතුය. මේ නීතිය කඩ කිරීම දඬුවම් ලැබිය හැකි ක්‍රියාවකි.

12. විභාග ශාලාව තුළ කිසිම අපේක්ෂකයෙකු අත කිසිම පොතපතක් හෝ සටහන් පොතක් හෝ සටහන් ලියන කඩදාසියක් හෝ තබා ගැනීම සම්පූර්ණයෙන්ම තහනම් ය. විභාගශාලාධිපතීන් නියම කළහොත් සෑම අපේක්ෂකයෙක්ම තමන් සන්තකව තිබෙන දෑ මේ මේ යයි සහතික කිරීමට බැඳී සිටී. මේ අවශ්‍යතා කඩකිරීම වංචා සහගත ක්‍රියාවක් කිරීමට යත්න දැරීමක් ලෙස සලකනු ලැබේ.

13. වෙනත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයකින් හෝ පොතපතකින් හෝ පත්‍රයකින් හෝ සටහන් සහිත කොළයකින් හෝ වෙන කිසිවකින් හෝ ගෙන, හොර උත්තර ලිවීම හෙවත් කොපි කිරීම, හොර උත්තර ලිවීමට යත්න දැරීමද තහනම් ය. තවත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයක් දෙස බැලීම ද නොකළ යුතුය. වෙන අයදුම්කරුවෙකුට උදව් දීමෙන් ද, වෙන අයදුම්කරුවෙකුගෙන් හෝ පුද්ගලයෙකුගෙන් හෝ උදව් ලබා ගැනීමෙන් ද සම්පූර්ණයෙන්ම වැළකිය යුතුය. උත්තර ලියා සම්පූර්ණ වූ සෑම කඩදාසියක්ම ලියමින් සිටින කඩදාසිය යට තබා ගත යුතුය. ලියන කඩදාසි මේසය මත විසුරුවා නොදැමිය යුතුය.

14. ප්‍රශ්න පත්‍රයකට උත්තර ලියන අතරතුර මොනම කරුණක් නිසාවත් ස්වල්ප වේලාවකටවත් විභාග ශාලාවෙන් පිටවී යාමට කිසිම අපේක්ෂකයෙකු ඉඩදෙනු නොලැබේ. එහෙත් යම්කිසි හදිසි කරුණක් නිසා විභාගාපේක්ෂකයෙකුට ඉන් පිටත යන්නට උවමනා වුවහොත් විභාග ශාලාධිපතිගේ සහකාර නිලධාරියෙකුගේ සුපරීක්ෂාකාරීත්වය යටතේ විභාග ශාලාවෙන් ඔහුට ස්වල්ප වේලාවකට පිටතට යාමට අවසර දෙනු ලැබේ. එසේ පිටතට යාමට පෙරත් නැවත විභාග ශාලාවට ඇතුළු වන විටත් ඔහු සෝදිසියකට භාජනය විය යුතුය.

15. විභාග ශාලාවේ දී පිළිතුරු ලියන විට විභාගය පටන් ගැනීමට පෙර හෝ නියම විභාග අපේක්ෂකයෙකු වෙනුවට ව්‍යාජ අපේක්ෂකයෙකු පෙනී සිටීම දඬුවම් ලැබිය යුතු ක්‍රියාවකි. අනන්‍යතා පත්‍ර වෙනස් කිරීම හෝ බොරු අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කිරීමත්, කෙනෙකුගේ අනන්‍යතා සහතිකය වෙනස් කිරීමත් එබඳු වරදවල් ය. විභාගාපේක්ෂකයන් එවැනි වරදට අසු නොවිය යුතුය.

16. විභාග අපේක්ෂකයෙකු නොවන අයෙක් කිසිම අපේක්ෂකයෙකුට අයථා අන්දමින් වංචා සහගත ලෙස උදව් දීම බරපතල වරදක් ලෙස සලකනු ලැබේ.

විභාග අපේක්ෂකයන් විසින් තමන්ගේ පරෙස්සම සඳහා පහත සඳහන් උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය. :—

(i) විභාගය පටන් ගන්නා නියමිත වේලාවට සෑහෙන පමණ කලින් විභාග ශාලාවට පැමිණෙන්න. එක් එක් ප්‍රශ්න පත්‍රය පටන් ගැනීමට නියමිත වේලාවට යටත් පිරිසෙයින් විනාඩි 10කට හෝ 15කට කලින් විභාග ශාලාවට පැමිණ සිටීම සෑහේ. විභාග ශාලාව පිහිටා ඇති ස්ථානය හරිහැටි නොදත් විට විභාගය පටන් ගන්නා දිනයට කලින් ඒ ගැන සොයා බලා නියම ස්ථානය හරි හැටි දැන සිටිය යුතුය.

(ii) යම්කිසි විෂයයකට ඇතුළත්වීම ගැන හෝ යම් විෂයයකට පෙනී සිටීමට ඇති සුදුසුකම් ගැන හෝ සැකයක් ඇති වූ විට එම ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීමට පටන් ගැනීමට පෙර විභාග ශාලාධිපතීන්ට ඒ බැව් සැළකර එම සැකය දුරුකර ගත යුතුයි. එලෙස ක්‍රියා නොකිරීම එම විෂයය හෝ විෂයයන් සම්බන්ධයෙන් තමන්ගේ විභාගාපේක්ෂකත්වය අවලංගු වී යාමට හේතු විය හැකිය.

(iii) විභාගයට පෙනී සිටීමේ දී අපේක්ෂකයන් සෑම විෂයයකටම පෙනී සිටින විට අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කළ යුතුය. අනන්‍යතාවය ඔප්පු කිරීම සඳහා අවශ්‍ය ලියවිලි විභාග ශාලාවේ දී ඉදිරිපත් නොකළහොත් ඔහුගේ විභාගාපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ තිබේ. යම් හෙයකින් ඒ සඳහා අවශ්‍ය ලියවිලි විභාගශාලාවට ගෙන ඒමට අමතක වුවහොත් ඒ බැව් විභාගශාලාධිපතීන්හට දන්වා විභාගය අවසන් වීමට පෙර එය ඉදිරිපත් කිරීමට මං සළසා ගත යුතුය.

(iv) විභාගය සඳහා සාමාන්‍යයෙන් සම්මත වර්ගයකට අයත් ලිපිද්‍රව්‍ය (එනම් ලියන කඩදාසි, තීන්ත පොවන කඩදාසි, ලැජර් කඩදාසි, සාරාංශ ලියන කඩදාසි) ආදිය සපයනු ලැබේ. සාමාන්‍යයෙන් කාටත් බෙදා දෙන වර්ගයකට වෙනස් වූ හෝ අමුතු මෝස්තරයක ලිපි ද්‍රව්‍ය ඔබට ලැබුණහොත් ඒ බව නොපමාව විභාගශාලාධිපතිට දැන්විය යුතුයි. විභාග ශාලාවේ දී ඔබට දෙනු ලබන කඩදාසි හැර වෙන මොනම කඩදාසියක්වත් ප්‍රශ්නවලට උත්තර ලිවීම සඳහා පාවිච්චි නොකළ යුතුයි. ඉතිරි වන කඩදාසි සහ වෙනත් ද්‍රව්‍ය අපිරිසිදු නොකර නැවත ප්‍රයෝජනයට ගත හැකි වන සේ ඔබගේ ලියන මේසය මත තබන්න. ඔබට ලඝුගණක වක්‍ර සපයන ලද්දේ නම් ඒවා පරිස්සමින් පාවිච්චි කොට ඔබේ ලියන මේසය මත තිබෙන්නට හැරිය යුතුය.

(v) විභාගාපේක්ෂකයන් තම තමන්ගේ පෑන්, පැන්සල්, තීන්ත කූඩු, මකන, රෙදි කෑලි, අඩිකෝදු, ජ්‍යාමිතික උපකරණ, පාට පැන්සල් පෙට්ටි, පාට හුණු පෙට්ටි යනාදිය රැගෙන ආ යුතුයි.

(vi) තමන් පාවිච්චි කරන සෑම කඩදාසියකම පිළිතුරු ලිවීමට පටන් ගැනීමේ දී නොපමාව තමන්ගේ විභාග අංකය හා විභාගයේ නමත් පැහැදිලි ලෙස ලියන්න. කඩදාසියේ දෙපැත්තේම පැහැදිලිව ද පිරිසිදුව ද උත්තර ලියන්න. ප්‍රශ්නයක කොටසකට උත්තර ලිවීමෙන් පසු අනික් කොටස පටන් ගැනීමට පෙර එක රූලක්වත් හිස්ව තිබිය යුතුයි. සම්පූර්ණ ප්‍රශ්නයකට උත්තර ලිවීමෙන් පසු රූලක් හෝ රූල් කීපයක් හෝ හිස්ව තබන්න. ලියන සෑම දෙයක්ම එක ගොඩේ තෝරා බේරා ගන්නට නොහැකි ලෙස නොලිවිය යුතුයි.

(vii) උත්තර ලියන කඩදාසියෙහි වම් පැත්තේ තීරය වෙන්කර ඇත්තේ ප්‍රශ්නවල අංක ලිවීම සඳහා ය. දකුණු පැත්තේ තීරය වෙන්කර ඇත්තේ පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා බැවින් එහි කිසිවක් නොලිවිය යුතුයි. තමන් විසින් උත්තර ලියන ලද ප්‍රශ්නවල අංක වරදවා යෙදීම ව්‍යාකූලත්වයට හේතුවන බැවින් ප්‍රශ්න අංක ඉතා පරෙස්සමින් නිවැරදි ලෙස යෙදිය යුතුය.

(viii) අනිවාර්ය ප්‍රශ්න ද, තෝරා ගත යුතු අන් ප්‍රශ්න ද සම්බන්ධව ප්‍රශ්න පත්‍රයේ මුලින්ම සඳහන් කොට ඇති උපදෙස් ඉතා පරෙස්සමින් කියවා බැලිය යුතුයි. මෙය නොසලකා හැරීමෙන් බොහෝ විට පාඩු සිදුවිය හැකිය.

(ix) ගණිත ප්‍රශ්නවලට උත්තර සපයන විට ගැන බැලීම සහ කටුවැඩ ඒ ඒ ගණන් සෑදීමේ කොටසක් වශයෙන් අනුක්‍රමයෙන් විස්තර ලෙස දැක්විය යුතුය. අවශ්‍ය තැන්වල අඳිනු ලබන රූප සටහන් හා චිත්‍ර ආදිය නිවැරදිව ද සෑහෙන පමණ විශාලව ද තිබිය යුතුයි. පිටු කීපයකට යන දිග පිළිතුරුවල දී එක පිටුවක අඳින ලද රූප සටහන් සම්බන්ධයෙන් ඊළඟ පිටුවලදීත් සිත් යොමුකර විය යුතු අවස්ථාවල දී ඒ රූප සටහන් නැවතත් ඇඳ පෙන්වීම යෝග්‍ය වේ.

(x) එක් එක් ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සපයා අවසන් වූ විට උත්තර ලියන ලද කඩදාසි සියල්ලම ප්‍රශ්නවලට උත්තර ලියූ පිළිවෙල අනුව එකතුකොට වම් පැත්තේ ඉහළ කෙළවරේ තමන්ට සපයන ලද නූල් කැබැල්ලෙන් නොගැලවී යන පරිදි එකට තබා අමුණා ගැටගසන්න. දකුණු පැත්තේ උඩ කෙළවරවල් එකට තබා ගැට නොගසන්න.

(xi) ඔබගේ උත්තර පත්‍රය විභාගශාලාධිපතීන්ට හෝ ඔවුන්ගේ සහකාර මහතකුට හෝ සියතින්ම භාරදිය යුතුය. නැතහොත් ඒවා එකතු කරන තුරු ඔබේ අසුනේම වාඩි වී සිටිය යුතුය. එසේ නොකිරීම ඇතැම් විට ඔබගේ උත්තර පත්‍රය නැති වී යාමට ද ඔබ යම් විෂයයකට ඉදිරිපත් නොවූවකු සේ සලකනු ලැබීමට ද හේතු විය හැකිය. මොනම කරුණක් නිසාවත් ඔබගේ උත්තර පත්‍රය විභාග ශාලාවේ සේවය කරන පියුන් කෙනෙකුට හෝ වෙනයම් සේවකයෙකුට හෝ බාර නොදිය යුතුය.

(xii) යම්කිසි කරුණක් නිසා විභාග ශාලාධිපතීන්ට හෝ ඔහුගේ සහකාර මහතෙකුට හෝ කථා කිරීමට අවශ්‍ය වූ විට ද, කඩදාසි ආදිය අවශ්‍ය වූ විට ද තම ආසනයෙන් නොනැගිට අත පමණක් එසවිය යුතුය.

**විභාග කොමසාරිස් ජනරාල්.**

පැලවත්ත,
බත්තරමුල්ල,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ දී ය.

# තනතුරු - ඇබෑර්තු

## රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

### කෑගල්ල දිස්ත්‍රික්කය

### උප්පැන්න, මරණ හා විවාහ රෙජිස්ට්‍රාර් තනතුරු අයදුම්පත් කැඳවීමේ දැන්වීම අවලංගු කිරීම

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1723 දරන 2011.09.09 දිනැති ගැසට් පත්‍රයේ I වන කොටසේ (IIඅ) වැනි ඡේදයේ මා විසින් පළ කරන ලද කෑගල්ල දිස්ත්‍රික්කයේ මුස්ලිම් විවාහ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු සඳහා ඉල්ලුම්පත් කැඳවීමේ නිවේදනයේ පහත සඳහන් කොට්ඨාසයේ පමණක් අයදුම්පත් කැඳවීම අවලංගු කරමි.

| *දිස්ත්‍රික්කය* | *ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය* | *ඉල්ලුම්පත් කැඳවූ කොට්ඨාසය හා තනතුර* |
|---|---|---|
| කෑගල්ල | මාවනැල්ල | ගල්බඩ කිනිගොඩ කෝරළය කොට්ඨාසයේ උයන්වත්ත (දෙවනගල) ප්‍රදේශයේ අතිරේක මුස්ලිම් විවාහ රෙජිස්ට්‍රාර් ධූරය |

ඊ. එම්. ගුණසේකර,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

2012 සැප්තැම්බර් මස 18 වැනි දින,
රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව,
234/ඒ3,
ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
බත්තරමුල්ල.

10-315

---

## රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

### මුස්ලිම් විවාහ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු — කළුතර දිස්ත්‍රික්කය

මෙහි පහත උපලේඛනයේ සඳහන් කොට්ඨාසවල ඇති විවාහ, උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු සඳහා ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

02. ඉල්ලුම්කරුවන් අදාළ උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ කොට්ඨාසය තුළ ස්ථිර පදිංචියක් ඇත්තා වූ හා සෑහෙන දේපළක් හිමි ප්‍රදේශවාසීන්ගේ සැලකිල්ල ලබන අය ද විය යුතු ය.

03. මෙම තනතුරු සඳහා මුස්ලිම් පුරුෂ පක්ෂයට පමණක් ඉල්ලුම් කළ හැකිය.

04. ඉල්ලුම්කරුවන්ගේ වයස අවුරුදු 30 ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 60 ට නොවැඩි විය යුතු ය.

05. ඉල්ලුම්කරුවන් විවාහක අය විය යුතු ය.

06. අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් ආදිය පිළිබඳ අමතර විස්තර අදාළ දිස්ත්‍රික් ලේකම් කාර්යාල, ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාල, ප්‍රාදේශීය ලේකම් කාර්යාල, ග්‍රාම නිලධාරි කාර්යාල, ග්‍රාම සංවර්ධන සමිති සහ සමුපකාර සමිති ආදී කොට්ඨාසයේ ප්‍රසිද්ධ ස්ථානවල ප්‍රදර්ශනය කර ඇති දැන්වීම්වලින් බලාගත හැකිය.

07. මේ සඳහා අවශ්‍ය ඉල්ලුම්පත් අදාළ දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් (දිසාපති) කාර්යාලයෙන් සහ ඉඩම් රෙජිස්ට්‍රාර් සහ දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් ලබාගත හැක.

08. සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත් 2012 නොවැම්බර් මස 05 වැනි දින හෝ එදිනට පෙර උපලේඛනයේ සඳහන් ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් යැවිය යුතු ය.

ඊ. එම්. ගුණසේකර,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

2012 සැප්තැම්බර් මස 13 වැනි දින,
බත්තරමුල්ල, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
අංක 234/A3, රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

#### උපලේඛනය

| *දිස්ත්‍රික්කය* | *ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය* | *ඉල්ලුම්පත් කැඳවන කොට්ඨාසය හා තනතුර* | *ඉල්ලුම්පත් එවිය යුතු ලිපිනය* |
|---|---|---|---|
| කළුතර | පානදුර | කළුතර හා පානදුර තොටමුණ කෝරළය කොට්ඨාසයේ හේනමුල්ල ප්‍රදේශයේ මුස්ලිම් විවාහ රෙජිස්ට්‍රාර් ධූරය | දිස්ත්‍රික් ලේකම්/ අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, කළුතර. |

10-141

---

## රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

### විවාහ, උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු — වව්නියාව දිස්ත්‍රික්කය

මෙහි පහත උපලේඛනයේ සඳහන් කොට්ඨාසවල ඇති විවාහ, උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු සඳහා ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

02. ඉල්ලුම්කරුවන් අදාළ උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ කොට්ඨාසය තුළ ස්ථිර පදිංචියක් ඇත්තා වූ හා සෑහෙන දේපළක් හිමි ප්‍රදේශවාසීන්ගේ සැලකිල්ල ලබන අය ද විය යුතු ය.

03. මෙම තනතුරු සඳහා ස්ත්‍රී/පුරුෂ දෙපක්ෂයටම ඉල්ලුම් කළ හැකි ය.

04. ඉල්ලුම්කරුවන්ගේ වයස අවුරුදු 30 ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 60 ට නොවැඩි විය යුතු ය.

05. ඉල්ලුම්කරුවන් විවාහක අය විය යුතු ය.

06. අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් ආදිය පිළිබඳ අමතර විස්තර අදාළ දිස්ත්‍රික් ලේකම් කාර්යාල, ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාල, ප්‍රාදේශීය ලේකම් කාර්යාල, ග්‍රාම නිලධාරි කාර්යාල, ග්‍රාම සංවර්ධන සමිති සහ සමුපකාර සමිති ආදී කොට්ඨාසයේ ප්‍රසිද්ධ ස්ථානවල ප්‍රදර්ශනය කර ඇති දැන්වීම්වලින් බලාගත හැකි ය.

07. මේ සඳහා අවශ්‍ය ඉල්ලුම්පත් අදාළ දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් (දිසාපති) කාර්යාලයෙන් සහ ඉඩම් රෙජිස්ට්‍රාර් සහ දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් ලබාගත හැක.

08. සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත් 2012 නොවැම්බර් මස 05 වැනි දින හෝ එදිනට පෙර උපලේඛනයේ සඳහන් ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් යැවිය යුතු ය.

ඊ. එම්. ගුණසේකර,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

2012 සැප්තැම්බර් මස 12 වැනි දින,
බත්තරමුල්ල, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
අංක 234/A3, රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

**උපලේඛනය**

| *දිස්ත්‍රික්කය* | *ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය* | *ඉල්ලුම්පත් කැඳවන කොට්ඨාසය හා තනතුර* | *ඉල්ලුම්පත් එවිය යුතු ලිපිනය* |
|---|---|---|---|
| වවුනියාව | වවුනියාව දකුණ සිංහල | වවුනියාව දකුණ සිංහල කොට්ඨාසයේ විවාහ (උඩරට/සාමාන්‍ය) රෙජිස්ට්‍රාර්ධුරය (සිංහල මාධ්‍ය) | දිස්ත්‍රික් ලේකම්/ අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, වවුනියාව |
| වවුනියාව | වවුනියාව දකුණ සිංහල | කිලක්කුමුලයි දකුණ කොට්ඨාසයේ උප්පැන්න මරණ සහ වවුනියාව දකුණ සිංහල කොට්ඨාසයේ විවාහ (උඩරට/සාමාන්‍ය) රෙජිස්ට්‍රාර්ධුරය (සිංහල මාධ්‍ය) | දිස්ත්‍රික් ලේකම්/ අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, වවුනියාව |
| වවුනියාව | වවුනියාව දකුණ සිංහල | මාමඩුව කොට්ඨාසයේ උප්පැන්න මරණ සහ වවුනියාව දකුණ සිංහල කොට්ඨාසයේ විවාහ (උඩරට/සාමාන්‍ය) රෙජිස්ට්‍රාර්ධුරය (සිංහල මාධ්‍ය) | දිස්ත්‍රික් ලේකම්/ අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, වවුනියාව |

10-147

**රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව**

දෙමළ භාෂාවෙන් විවාහ, උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු — වව්නියාව දිස්ත්‍රික්කය

මෙහි පහත උපලේඛනයේ සඳහන් කොට්ඨාසවල ඇති විවාහ, උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු සඳහා ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

01. ඉල්ලුම්කරුවන් අදාළ උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ කොට්ඨාසය තුළ ස්ථිර පදිංචියක් ඇත්තා වූ හා සෑහෙන දේපළක් හිමි ප්‍රදේශවාසීන්ගේ සැලකිල්ල ලබන අය ද විය යුතු ය.

02. මෙම තනතුර සඳහා ස්ත්‍රී/පුරුෂ දෙපක්ෂයට ම ඉල්ලුම් කළ හැකිය.

03. ඉල්ලුම්කරුවන්ගේ වයස අවුරුදු 30 ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 60 ට වැඩි නොවිය යුතු ය.

04. ඉල්ලුම්කරුවන් විවාහක අය විය යුතු ය.

05. අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් ආදිය පිළිබඳ අමතර විස්තර අදාළ දිස්ත්‍රික් ලේකම් කාර්යාල, ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාල, ප්‍රාදේශීය ලේකම් කාර්යාල, ග්‍රාම නිලධාරි කාර්යාල, ග්‍රාම සංවර්ධන සමිති සහ සමුපකාර සමිති ආදී කොට්ඨාසයේ ප්‍රසිද්ධ ස්ථානවල ප්‍රදර්ශනය කර ඇති දැන්වීම්වලින් බලාගත හැකිය.

06. මේ සඳහා අවශ්‍ය ඉල්ලුම්පත් අදාළ දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් (දිසාපති) කාර්යාලයෙන් සහ ඉඩම් රෙජිස්ට්‍රාර් සහ දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් ලබාගත හැකිය.

07. සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත් 2012 නොවැම්බර් මස 05 වැනි දින හෝ එදිනට පෙර උපලේඛනයේ සඳහන් ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපැල් මගින් යැවිය යුතු ය.

ඊ. එම්. ගුණසේකර,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

2012 සැප්තැම්බර් මස 12 වැනි දින,
බත්තරමුල්ල, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
අංක 234/A3,
රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

**උපලේඛනය**

| *දිස්ත්‍රික්කය* | *ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය* | *ඉල්ලුම්පත් කැඳවන කොට්ඨාසය හා තනතුර* | *ඉල්ලුම්පත් එවිය යුතු ලිපිනය* |
|---|---|---|---|
| වවුනියාව | වවුනියාව උතුර | මලේපත්තු නැගෙනහිර කොට්ඨාසයේ උප්පැන්න මරණ සහ වවුනියාව උතුර කොට්ඨාසයේ විවාහ (සාමාන්‍ය) රෙජිස්ට්‍රාර්ධුරය. (දෙමළ මාධ්‍ය) | දිස්ත්‍රික් ලේකම්/ අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, වවුනියාව |

10-148

## රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

### මුස්ලිම් විවාහ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු — කෑගල්ල දිස්ත්‍රික්කය

මෙහි පහත උපලේඛනයේ සඳහන් කොට්ඨාසවල ඇති විවාහ, උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු සඳහා ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

02. ඉල්ලුම්කරුවන් අදාළ උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ කොට්ඨාසය තුළ ස්ථිර පදිංචියක් ඇත්තා වූ හා සෑහෙන දේපළක් හිමි ප්‍රදේශවාසීන්ගේ සැලකිල්ල ලබන අය ද විය යුතු ය.

03. මෙම තනතුර සඳහා මුස්ලිම් පුරුෂ පක්ෂයට පමණක් ඉල්ලුම් කළ හැකිය.

04. ඉල්ලුම්කරුවන්ගේ වයස අවුරුදු 30 ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 60 ට නොවැඩි විය යුතු ය.

05. ඉල්ලුම්කරුවන් විවාහක අය විය යුතු ය.

06. අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් ආදිය පිළිබඳ අමතර විස්තර අදාළ දිස්ත්‍රික් ලේකම් කාර්යාල, ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාල, ප්‍රාදේශීය ලේකම් කාර්යාල, ග්‍රාම නිලධාරි කාර්යාල, ග්‍රාම සංවර්ධන සමිති සහ සමුපකාර සමිති ආදී කොට්ඨාසයේ ප්‍රසිද්ධ ස්ථානවල ප්‍රදර්ශනය කර ඇති දැන්වීම්වලින් බලාගත හැකිය.

07. මේ සඳහා අවශ්‍ය ඉල්ලුම්පත් අදාළ දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් (දිසාපති) කාර්යාලයෙන් සහ ඉඩම් රෙජිස්ට්‍රාර් සහ දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් ලබාගත හැක.

08. සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත් 2012 නොවැම්බර් මස 05 වැනි දින හෝ එදිනට පෙර උපලේඛනයේ සඳහන් ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් යැවිය යුතු ය.

ඊ. එම්. ගුණසේකර,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

2012 සැප්තැම්බර් මස 18 වැනි දින,
බත්තරමුල්ල, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
අංක 234/A3, රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

### උපලේඛනය

| දිස්ත්‍රික්කය | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | ඉල්ලුම්පත් කැඳවන කොට්ඨාසය හා තනතුර | ඉල්ලුම්පත් එවිය යුතු ලිපිනය |
|---|---|---|---|
| කෑගල්ල | මාවනැල්ල | ගල්බඩ කිනිගොඩ කෝරළය කොට්ඨාසයේ උයන් වත්ත ප්‍රදේශයේ මුස්ලිම් විවාහ රෙජිස්ට්‍රාර් ධුරය. | දිස්ත්‍රික් ලේකම්/ අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, කෑගල්ල. |

10-314

## ශ්‍රී ලංකා ගුවන් හමුදාව

### නිලධාරි පුරප්පාඩු

ශ්‍රී ලංකා නිත්‍ය/ස්වේච්ඡා ගුවන් හමුදාවේ පහත සඳහන් ශාඛාවන්හි ඉඳුරාම අධිකාරියට පත්කොට බඳවා ගැනීමට පිරිමි/කාන්තා අපේක්ෂකයින් සඳහා පුරප්පාඩු පවතී :-

(අ) කාර්මික ඉංජිනේරු ශාඛාව
(ආ) උපකරණ ශාඛාව
(ඇ) ගුවන් තොටුපළ නිර්මාණ ශාඛාව
(ඈ) වෛද්‍ය ශාඛාව
(ඉ) දන්ත වෛද්‍ය ශාඛාව
(ඊ) පාලන පශු වෛද්‍ය ශාඛාව
(උ) පාලන අධ්‍යාපන ශාඛාව

2. පහත සඳහන් වෘත්තීය සුදුසුකම් ඇති පිරිමි/කාන්තා අපේක්ෂකයින්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. :-

(අ) කාර්මික ඉංජිනේරු ශාඛාව :
කාර්මික ඉංජිනේරු නිලධාරි - පිරිමි (නිත්‍ය) :

පිළිගත් විශ්වවිද්‍යාලයක සිව් (4) අවුරුදු පූර්ණ කාලීන යාන්ත්‍රික /මෝටර් රථ ඉංජිනේරු විද්‍යාවේදී උපාධිය හෝ මොරටුව විශ්වවිද්‍යාලය මගින් පිරිනමන ලද තුන් (3) අවුරුදු පූර්ණ කාලීන යාන්ත්‍රික ඉංජිනේරු ශිල්පය පිළිබඳ ජාතික තාක්ෂණ ඩිප්ලෝමාව (එන්ඩීටී) හෝ ශ්‍රී ලංකා උසස් තාක්ෂණ ආයතනය මගින් පිරිනමන ලද අවුරුදු තුන හමාරක (3 1/2) පූර්ණ කාලීන යාන්ත්‍රික ඉංජිනේරු ශිල්පය පිළිබඳ උසස් ජාතික ඩිප්ලෝමාව (එච්.එන්.ඩී.ඊ) හෝ ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය මගින් ප්‍රදානය කරනු ලබන යාන්ත්‍රික ඉංජිනේරු විද්‍යා ජාතික ඩිප්ලෝමාව (එන්. ඩී. ඊ. එස්) ලබා තිබීම. ;

කාර්මික ඉංජිනේරු නිලධාරි - පිරිමි (ස්වේච්ඡා) :

ස්වේච්ඡා කෙටි කාලීන අධිකාරිය සඳහා ඉහත සඳහන් වෘත්තීය සුදුසුකම ලබා ගැනීමෙන් පසුව මෝටර් රථ ඉංජිනේරු ක්ෂේත්‍රයේ අදාල තනතුර පිළිබඳව අවම වශයෙන් වසර දහයක (10) පලපුරුද්දක් ලබා තිබීම ;

(ආ) උපකරණ ශාඛාව ඃ
භෝජනාගාර කළමණාකරුවන් - පිරිමි (නිත්‍ය/ස්වේච්ඡා)

හෝටල් කළමනාකරණය පිළිබඳ උසස් ඩිප්ලෝමා සහතිකයක් ලබා තිබීම හෝ දේශීය/විදේශීය ආයතනයක හදාරන ලද කාණ්ඩ 4කින් සමන්විත පූර්ණකාලීන ආගන්තුක සත්කාර පිළිබඳ මූලික, මධ්‍යම සහ උසස් පාඨමාලාවක් හදාරා තිබීම හා තරු පංති හෝටලයක ආහාරපාන අංශයේ භෝජනාගාර හා ආහාර කළමණාකරණය පිළිබඳව ඉහත සුදුසුකම් වලින් පසුව අදාල ක්ෂේත්‍රයේ වසර දෙකක (2) පළපුරුද්දක් ලබා තිබිය යුතුයි.

(ඇ) ගුවන් තොටුපළ නිර්මාණ ශාඛාව ඃ
ද්‍රව්‍ය ඉංජිනේරු නිලධාරීන් (තාර යන්ත්‍රෝපකරණ සඳහා) - පිරිමි (නිත්‍ය/ස්වේච්ඡා)

ද්‍රව්‍ය ඉංජිනේරු විද්‍යාවේදී උපාධිය හෝ භෞතික විද්‍යාවේදී උපාධිය හෝ සිවිල් ඉංජිනේරු විද්‍යාවේදී උපාධිය සමග උපාධි

සුදුසුකම්වලින් පසුව මහාමාර්ග සහ ගුවන් ධාවන පථ ඉදිකිරීමට භාවිතා කරන තාර මිශ්‍රණ යන්ත්‍ර පිළිබඳව සහ තාර මිශ්‍රණ තත්ව පරීක්ෂණ පිළිබඳව අවම වශයෙන් වසරක පළපුරුද්දක් තිබිය යුතු අතර මහාමාර්ග සහ ගුවන් ධාවන පථ ඉදිකිරීමට භාවිතා කරන මිශ්‍රණ සැදීම, ඒ සඳහා යොදා ගන්නා අමුද්‍රව්‍ය පරීක්ෂා කිරීමේ හැකියාව සහ බහුවිධ පරීක්ෂණාගාර පරිපාලන කිරීමෙහිලා මනා දැනුමක් සහ පලපුරුද්දක් තිබිය යුතු ය. තෝරාගනු ලබන අපේක්ෂකයින් ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ ෆ්ලයිට් ලෙප්ටිනන්ට් යන නිලයෙහි අධිකාරියට පත් කරනු ලැබේ.

**ගොඩනැගිලි සේවා ඉංජිනේරු නිලධාරීන් - පිරිමි (නිත්‍ය/ස්වේච්ඡා)**

සිවිල්/යාන්ත්‍රික ඉංජිනේරු විද්‍යාවේදී උපාධිය සහ විද්‍යාපති (ගොඩනැගිලි සේවා ඉංජිනේරු) උපාධිය සමග වායු සමීකරණ, ජල සැපයුම්, සනීපාරක්ෂක, මහජන සෞඛ්‍යය, ගිනි ආරක්ෂණය, විදුලි සෝපාන ආදී නව තාක්ෂණික ක්‍රමෝපායන් භාවිතයෙන් ගොඩනැගිලි නිර්මාණය/ඉදිකිරීම පිළිබඳව විද්‍යාපති උපාධියෙන් පසුව අදාල ක්ෂේත්‍රයේ වසරක පළපුරුද්දක් ලබා තිබිය යුතුයි. තෝරාගනු ලබන අපේක්ෂකයින් ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ ස්කොඩ්‍රන් ලීඩර් යන නිලයෙහි අධිකාරියට පත්කරනු ලැබේ.

**සිවිල්/විදුලි ඉංජිනේරු නිලධාරීන් - පිරිමි (නිත්‍ය)**

සිවිල්/විදුලි ඉංජිනේරු විද්‍යාවේදී උපාධිය හෝ ඒ හා සමාන සුදුසුකම් තිබීම හෝ සිවිල්/විදුලි ඉංජිනේරු ජාතික තාක්ෂණ ඩිප්ලෝමාව (එන්. ඩී. ටී)/ඉංජිනේරු විද්‍යා ජාතික ඩිප්ලෝමාව (එන්. ඩී. ඊ. එස්.) /උසස් ජාතික ඩිප්ලෝමාව (එච්. එන්. ඩී. ඊ) හෝ ඒ හා සමාන සුදුසුකම් ලබා තිබිය යුතු අතර ඩිප්ලෝමා සුදුසුකම්වලින් පසුව අදාල ක්ෂේත්‍රයේ වසර තුනක (3) පලපුරුද්දක් සහිත සහ රහිත අපේක්ෂකයින්හට මේ සඳහා අයදුම් කළ හැක.

**වාස්තු විද්‍යාඥයන් - පිරිමි/කාන්තා (නිත්‍ය/ස්වේච්ඡා)**

Bsc (BE) උපාධිය සමග වසරක රැකියා පුහුණුවක්/පලපුරුද්දක් ලබා තිබීම හෝ මොරටුව විශ්වවිද්‍යාලය මගින් පිරිනමන ලද B Arch උපාධිය ලබා තිබීම. තෝරාගනු ලබන අපේක්ෂකයින් ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ ෆ්ලයිට් ලෙප්ටිනන්ට් යන නිලයෙහි අධිකාරියට පත් කරනු ලැබේ.

**ප්‍රමාණ සමීක්ෂක නිලධාරීන් - පිරිමි/කාන්තා (නිත්‍ය/ස්වේච්ඡා)**

මොරටුව විශ්වවිද්‍යාලය මගින් පිරිනමන ලද BSc in (QS) උපාධිය හෝ ශ්‍රී ලංකා ප්‍රමාණ සමීක්ෂකයින්ගේ ආයතනයේ සාමාජිකත්වය (Graduate Member) හෝ ශ්‍රී ලංකා ප්‍රමාණ සමීක්ෂකයින්ගේ ආයතනයේ සාමාජිකත්වය (Technical Member) ලබා තිබීම සමග සාමාජිකත්වයෙන් පසුව අදාල ක්ෂේත්‍රයේ තනතුර පිළිබඳව වසර තුනක (3) පලපුරුද්දක් ලබා තිබීම හෝ

ශ්‍රී ලංකා ප්‍රමාණ සමීක්ෂකයින්ගේ ආයතනයේ සාමාජිකත්වය (Technical Member) ලබා තිබීම හෝ රත්මලාන UNIVOTEC ආයතනයේ සම්පූර්ණයෙන් නිමකරන ලද ප්‍රමාණ සමීක්ෂක ජාතික ඩිප්ලෝමාව ලබා තිබීම සමග ඩිප්ලෝමා සුදුසුකම්වලින් පසුව අදාල ක්ෂේත්‍රයේ තනතුර පිළිබඳව වසර දෙකක (2) පලපුරුද්දක් ලබා තිබීම.

**මිනින්දෝරුවන් - පිරිමි (නිත්‍ය/ස්වේච්ඡා)**

මිනින්දෝරු විද්‍යාවේදී උපාධිය/දියතලාව මිණුම් සහ සිතියම් ගත කිරීමේ ආයතනයෙන් පිරිනමන ලද උපාධියක් හෝ ඩිප්ලෝමාවක් ලබා තිබීම.

(ඈ) වෛද්‍ය ශාඛාව :

**වෛද්‍ය නිලධාරීන් - පිරිමි/කාන්තා (නිත්‍ය/ස්වේච්ඡා)**

*ෆ්ලයිට් ලෙප්ටිනන්ට් :* පිළිගත් විශ්වවිද්‍යාලයක වෛද්‍ය (එම්. බී. බී. එස්) උපාධිය හෝ ඒ හා සමාන සුදුසුකම් තිබීම සහ වෛද්‍ය සභා මණ්ඩලයේ පූර්ණ කාලීනව ලියාපදිංචි වී තිබීම.

**පූර්ව සීමාවාසික වෛද්‍ය උපාධිලාභීන් - පිරිමි/කාන්තා (ස්වේච්ඡා)**

MBBS (ශ්‍රී ලංකා) හෝ විදේශ වෛද්‍ය විද්‍යාලයකින් සමත්වූ ශ්‍රී ලංකා වෛද්‍ය සභාව මගින් පිළිගත හැකි MBBS (ශ්‍රී ලංකා) උපාධියට සමාන වෛද්‍ය උපාධියක් අනිවාර්‍යයෙන්ම ලබා තිබිය යුතු ය. සුදුසුකම් ඇති තෝරාගත් අයදුම්කරුවන් ස්වේච්ඡා අධිකාරිලත් නිලධාරීන් ලෙස බඳවාගනු ලැබේ. බඳවාගත් දින සිට අවුරුදු පහක් (5) ඇතුලත ERPM විභාගය සමත් වී ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ ස්ථිර ලියාපදිංචිය ලබා ගත යුතු ය. එසේ වෛද්‍යවරයෙකු ලෙස ස්ථිරව ලියාපදිංචි වීමට අපොහොසත් වන නිලධාරීන්ගේ සේවය අවුරුදු පහකට (5) පසු අත්හිටුවනු ලැබේ.

තෝරාගනු ලබන අයදුම්කරුවන් ෆ්ලයින් ඔෆිසර් නිලයෙහි අධිකාරිලත් නිලධාරීන් ලෙස බඳවා ගනු ලබන අතර ERPM විභාගය සමත්වී ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ ස්ථිර ලියාපදිංචියෙන් පසු ෆ්ලයිට් ලෙප්ටිනන්ට් නිලය ලබාදීම පිළිබඳව සලකා බලනු ලැබේ.

(ඉ) දන්ත වෛද්‍ය ශාඛාව :

**දන්ත වෛද්‍ය නිලධාරීන් - පිරිමි/කාන්තා (නිත්‍ය/ස්වේච්ඡා)** :

*ෆ්ලයිට් ලෙප්ටිනන්ට් :* පිළිගත් විශ්වවිද්‍යාලයක දන්ත වෛද්‍ය (බී. ඩී. එස්.) උපාධිය හෝ ඒ හා සමාන සුදුසුකම් තිබීම සහ වෛද්‍ය සභා මණ්ඩලයේ ලියාපදිංචි වී තිබිය යුතු ය.

**දන්ත වෛද්‍ය ශිෂ්‍යයන් - පිරිමි/කාන්තා (නිත්‍ය)** :

*පයිලට් ඔෆිසර් :* බී. ඩී. එස්. දෙවැනි කොටස සම්පූර්ණ කර දැනට තුන්වන වසරේ දන්ත වෛද්‍ය (බී. ඩී. එස්.) උපාධිය සඳහා ඉගෙනුම ලබන සිසුන් හට මේ සඳහා අයදුම් කළ හැක.

*ෆ්ලයින් ඔෆිසර් :* අවසාන බී. ඩී. එස්. පළමු කොටස සම්පූර්ණ කර දැනට අවසන් වසරේ දන්ත වෛද්‍ය (බී. ඩී. එස්.) උපාධිය සඳහා ඉගෙනුම ලබන සිසුන් හට මේ සඳහා අයදුම් කළ හැක.

*සැලකිය යුතුයි :*

1. තෝරාගනු ලබන දන්ත වෛද්‍ය ශිෂ්‍ය අයදුම්කරුවන් ෆ්ලයිට් ලෙප්ටිනන්ට් නිලයෙහි ස්ථිර අධිකාරියට පත් කරනු ලැබූ දින සිට වසර දහයක (10) අනිවාර්ය සේවයකට යටත් කරනු ලැබේ.

2. තෝරාගනු ලබන දන්ත වෛද්‍ය සිසුන් අවසන් වසර සම්පූර්ණ කරන තුරු ගුවන් හමුදාවෙන් නිදහස් කරනු ලැබේ.

දන්ත වෛද්‍ය (බී. ඩී. එස්.) උපාධිය සම්පූර්ණ කිරීමෙන් පසු සහ වෛද්‍ය සභා මණ්ඩලයේ ලියාපදිංචි වීමෙන් අනතුරුව ඔවුන් ෆ්ලයිට් ලෙප්ටිනන්ට් නිලයෙහි ස්ථිර අධිකාරියට පත් කරනු ලැබේ.

3. පශ්චාත් උපාධි අධ්‍යාපන කටයුතු සඳහා සේවා අවශ්‍යතාවයන් මත අවස්ථාවක් දෙනු ලැබේ.

4. දන්ත වෛද්‍ය සිසුන් තම විශ්වවිද්‍යාලයේ අධ්‍යයන වසර තහවුරු කරගත හැකි ලියවිල්ලක් අයදුම්පත සමග එවිය යුතු ය;

(ඊ) *පාලන පශු වෛද්‍ය ශාඛාව :*

**පශු වෛද්‍ය නිලධාරීන් - පිරිමි (නිත්‍ය/ස්වේච්ඡා)** :

*ෆ්ලයිට් ලෙප්ටිනන්ට් :* පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ පශු වෛද්‍ය උපාධිය හෝ ඒ හා සමාන සුදුසුකම් තිබීම සහ පශු වෛද්‍ය සභා මණ්ඩලයේ ලියාපදිංචි වී තිබීම.;

(උ) *පාලන අධ්‍යාපන ශාඛාව* :

**ඉංග්‍රීසි භාෂා උපදේශකයන් - පිරිමි/කාන්තා (ස්වේච්ඡා)**

අ. පො. ස. (උ. පෙළ) විභාගයෙන් ප්‍රධාන විෂයන් තුනකට සාමාන්‍ය සාමාර්ථ ලබා තිබීම සහ ජාතික/අධ්‍යාපන විද්‍යා පීඨයක වසර තුනක ඉංග්‍රීසි භාෂාව පිළිබඳ පාඨමාලාවක් සාර්ථක ලෙස හැදෑරීමෙන් පසු ඉංග්‍රීසි භාෂා ගුරුවරයෙක් ලෙස අවම වශයෙන් වසරක (1) සේවා කාලයක් ඉගැන්වීමේ පළපුරුද්ද ලබා තිබීම, හෝ

අ. පො. ස. (උ. පෙළ) විභාගයෙන් ප්‍රධාන විෂයන් තුනකට සාමාන්‍ය සාමාර්ථ ලබා තිබීම සහ රජයේ අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ ගුරු අභ්‍යාස විද්‍යාලයක වසර දෙකක ඉංග්‍රීසි භාෂාව පිළිබඳ පාඨමාලාව සාර්ථක ලෙස හැදෑරීමෙන් පසු ඉංග්‍රීසි භාෂා ගුරුවරයෙක් ලෙස අවම වශයෙන් වසර තුනක (3) සේවා කාලයක් ඉගැන්වීමේ පළපුරුද්ද ලබා තිබීම, හෝ

පිළිගත් විශ්වවිද්‍යාලයක ශාස්ත්‍රවේදී උපාධිය/විද්‍යාවේදී උපාධිය සමග ඉංග්‍රීසි භාෂාව විෂයක් ලෙස හදාරා තිබීම හෝ අධ්‍යාපනවේදී උපාධිය ඉංග්‍රීසි මාධ්‍යයෙන් හදාරා තිබීම හෝ ශාස්ත්‍රවේදී උපාධිය/විද්‍යාවේදී උපාධිය ඉංග්‍රීසි මාධ්‍යයෙන් හදාරා තිබීම සහ වෘත්තීමය ඉංග්‍රීසි භාෂා ගුරුවරයෙක් ලෙස අවම වශයෙන් අවුරුද්දක (1) පළපුරුද්දක් ලබා තිබීම, හෝ

පිළිගත් විශ්වවිද්‍යාලයක ශාස්ත්‍රවේදී උපාධිය/විද්‍යාවේදී උපාධිය සහ අධ්‍යාපනවේදී ඩිප්ලෝමාවක් හදාරා තිබීම හෝ ශාස්ත්‍රපති උපාධිය/විද්‍යාපති උපාධිය සමග ඉංග්‍රීසි භාෂාව විෂයයක් ලෙස හදාරා තිබීම හෝ ශාස්ත්‍රපති උපාධිය/විද්‍යාපති උපාධිය ඉංග්‍රීසි මාධ්‍යයෙන් හදාරා තිබීම සහ වෘත්තීමය ඉංග්‍රීසි භාෂා ගුරුවරයෙක් ලෙස අවම වශයෙන් අවුරුද්දක (1) පළපුරුද්දක් ලබා තිබිය යුතු ය.

3. *අනෙකුත් සුදුසුකම්* :

(අ) *පුරවැසිභාවය :* ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතු ය ;
(ආ) *සිවිල් තත්වය :* විවාහක/අවිවාහක ;
(ඇ) *ස්ත්‍රී පුරුෂ භාවය :* පිරිමි/කාන්තා (අදාල පරිදි)
(ඈ) *වයස :* 2012 ඔක්තෝබර් මස 31 වැනි දිනට;

*(1) නිත්‍ය කාර්මික ඉංජිනේරු, නිත්‍ය දන්ත වෛද්‍ය (දන්ත වෛද්‍ය ශිෂ්‍යයන්) සහ උපකරණ ශාඛාවන්වල අපේක්ෂකයින් සඳහා :* අවුරුදු 18 සිට 30 දක්වා

*(2) ගුවන් තොටුපළ නිර්මාණ, වෛද්‍ය, දන්ත වෛද්‍ය සහ පාලන පශු වෛද්‍ය ශාඛාවන්වල අපේක්ෂකයින් සඳහා: අවුරුදු 18 සිට 35 දක්වා*

*(3) ස්වේච්ඡා කාර්මික ඉංජිනේරු සහ පාලන අධ්‍යාපන ශාඛාවන්වල අපේක්ෂකයින් සඳහා :*
අවුරුදු 18 සිට 40 දක්වා

(ඉ) *උස :* පිරිමි - අඩි 5 අඟල් 5 ක් හෝ ඊට වැඩි විය යුතු ය;
කාන්තා - අඩි 5 අඟල් 4 ක් හෝ ඊට වැඩි විය යුතු ය;

(ඊ) *බර :* ශරීර ස්කන්ධ දර්ශකය ගුවන් හමුදා ශාරීරික නිපුණතා පරීක්ෂණ ප්‍රමිතියට අදාලව විය යුතුයි. :

$$\text{ශරීර ස්කන්ධ දර්ශකය} = \frac{\text{බර (කි.ග්‍රෑ)}}{\text{උස}^2 \text{ (මී)}};$$

(උ) *පපුව :* අඟල් 32ට නොඅඩු විය යුතුයි (පිරිමි);
(ඌ) *වර්ණ දෘෂ්ටිය :* සීපී2;
(එ) *දෘෂ්ටි තීක්ෂණත්වය :* වම් ඇස 6/6 සහ දකුණු ඇස 6/6 (උපැස් සහිතව හෝ රහිතව).

4. යම් අයදුම්කරුවෙකුගේ උස නියමිත පරිදි නොමැති වුව ද හමුදා සේවයට ප්‍රයෝජනවත් වන විශේෂ නිපුණතාවයක් ඇත්නම් ගුවන් හමුදාධිපතිගේ මනාපය පරිදි ඔහු/ඇය ගැන සලකා බලනු ලැබේ.

5. ගුවන් හමුදාධිපතිවරයා විසින් නියම කරනු ලබන වෛද්‍ය පරීක්ෂණයකින් සමත්වීමට හැකි ආකාරයට මනා සෞඛ්‍ය තත්ත්වයකින් සිටිය යුතු ය.

6. ක්‍රීඩා ක්ෂේත්‍රයේ වර්තමාන විශිෂ්ට දක්ෂතා ලබා තිබීම පිළිබඳව නිසි සැලකිල්ලක් දක්වනු ලැබේ.

7. *රාජ්‍ය භාෂා අවශ්‍යතා* :— තෝරාගනු ලබන අපේක්ෂකයින් රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම පිණිස විශේෂයෙන් 1956 අංක 33 දරන රාජ්‍ය භාෂා පනතේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම සඳහාත් දැනට පවත්නා, පනවා ඇති සහ මතු පනවනු ලබන්නා වූ ද ව්‍යවස්ථා පිළිපැදිය යුතු ය.

8. තෝරාගනු ලබන අපේක්ෂකයින්ට ඔවුන්ගේ සුදුසුකම් හා පළපුරුද්ද අනුව ගුවන් හමුදාවේ පයිලට් ඔෆිසර්/ෆ්ලයින් ඔෆිසර්/ෆ්ලයිට් ලෙප්ටිනන්ට් / ස්කොඩ්‍රන් ලීඩර් යන නිලයන් හි නිත්‍ය/ස්වේච්ඡා අධිකාරියට පත්කරනු ලැබේ.

9. තෝරාගනු ලබන අපේක්ෂකයින් ගුවන් හමුදාධිපති විසින් තීරණය කරනු ලැබිය හැකි ස්ථානයක දී පුහුණුවක් ලැබිය යුතු ය. පුහුණුවන අවස්ථාවේ දී විෂමාචාරය නිසා හෝ තමාට පාලනය කරගත හැකිව තිබූ වෙනත් කරුණු නිසා හෝ නිලධාරියෙකුට නුසුදුසු බවට වගකිව යුත්තන් විසින් වාර්තා කරනු ලැබුවහොත් එම නිලධාරියාට පිරිනමනු ලැබූ අධිකාරිය ආපසු ගැනීම සහ/හෝ ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ විනය රෙගුලාසිවලට අනුකූලව වෙනයම් විනයානුකූල ක්‍රියාමාර්ගයන්ට යටත්වීමට හෝ බැඳී සිටින්නේය.

10. විටින් විට පනවනු ලබන ගුවන් හමුදා නියෝග අනුව ගුවන් හමුදා නිලධාරීන් පාලනය කරනු ලැබේ.

11. 1951 අප්‍රේල් මස 27 වැනි දින අංක 10,240 දරන *ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරනු ලැබූ කලින් කල සංශෝධනය කරන ලද, ශ්‍රී ලංකා ගුවන් හමුදා (නිත්‍ය හා නිත්‍ය උපසේවා) රෙගුලාසි අනුව ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ නිලධාරියෙකුගේ සේවා කොන්දේසි වේ. සුදුසුකම් අනුව පයිලට් ඔෆිසර් හෝ උසස් නිලයක නිත්‍ය/ස්වේච්ඡා අධිකාරියක් පිරිනමනු ලැබේ. ගුවන් හමුදා පනතේ 10 වැනි වගන්තිය අනුව "සෑම නිලධාරියෙකුම සේනාධිනායකයාගේ මනාපය පරිදි තම පත්වීමේ සිටිය හැක". කෙසේ වෙතත් තම අධිකාරියෙන් අස්වීමට නිලධාරියෙකුට බලයක් නැති අතර, ගුවන් හමුදා පනතේ 11 වැනි වගන්තිය අනුව සේනාධිනායක විසින් අස්වීමට ඉඩදිය හැක. ඇප/ගිවිසුම් බැඳී ඇත්නම් පුහුණු කාලය සහ

පාඨමාලාවන් හදාරන්නේ නම් ඉහත සඳහන් පරිදි ගුවන් හමුදා පනතේ 11 වැනි වගන්තිය අනුව අස්වීමට නොහැක. ගුවන් හමුදාවේ විශ්‍රාම වැටුප් සහ පාරිතෝෂික රෙගුලාසිවලට අනුව ගුවන් හමුදාවෙන් විශ්‍රාම ගැනීමට හැකි වේ.

12. ගුවන් හමුදා නිලධාරීන් රාජකාරි හෝ පුහුණුව සඳහා ඕනෑම අවස්ථාවක දී ලෝකයේ කවර තැනකට වුව ද යවනු ලැබීමට යටත් වේ.

13. අවිවාහක නිලධාරීන්, නිලධාරි නිවස්නයේ වාසය කළ යුතු ය. ගෘහ භාණ්ඩ සහ නවාතැන් පහසුකම් හා ආහාරපාන ඔහුට/ඇයට සපයනු ලැබේ. බැට්මන් සේවය ද සපයනු ලැබේ. අවිවාහක නිලධාරීන්ගේ ආහාර දීමනාව සහ බැට්මන් දීමනාව භෝජනාගාරයට ගෙවනු ලැබේ.

14. විවාහක නිලධාරීන්ට විවාහක නිවාස ඇත්නම් සපයනු ලැබේ. මේ සඳහා රජයේ ආයතන සංග්‍රහයට අනුව කුලිය අයකරනු ලැබේ. විවාහක නිලධාරීන් විවාහක නිවස්නයක වාසය කරනු නොලබන්නේ නම් 15(ඉ)(17) ඡේදයේ පරිදි නිවාස කුලී දීමනාවන් හිමි වේ.

15. (*අ*) ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ අධිකාරිලත් නිලධාරීන්ගේ වැටුප් පහත සඳහන් පරිදි වේ :

පයිලට් ඔෆිසර් - රු. 2,29,200 වසරකට
ෆ්ලයිට් ඔෆිසර් - රු. 2,75,220 — 34 x 7,740 = රු. 5,38,380 වසරකට
ෆ්ලයිට් ලෙප්ටිනන්ට් - රු. 3,21,660 — 28 x 7,740 = රු. 5,38,380 වසරකට
ස්කොඩ්‍රන් ලීඩර් - රු. 3,52,620 — 24 x 7,740 = රු. 5,38,380 වසරකට
විංග් කමාන්ඩර් - රු. 3,62,100 — 20 x 9,480 = රු. 5,51,700 වසරකට
ගෲප් කැප්ටන් - රු. 4,41,060 — 18 x 12,600 = රු. 6,67,860 වසරකට

(*ආ*) වෛද්‍ය නිලධාරීන්ගේ වැටුප් :

ප්‍රාථමික ශ්‍රේණිය - රු. 3,13,920 - 2 x 7,740 = රු. 3,29,400 වසරකට
2 වැනි ශ්‍රේණිය - රු. 3,37,140 - 8 x 7,800 = රු. 3,99,540 වසරකට
1 වැනි ශ්‍රේණිය - රු. 4,12,140 - 15 x 12,600 = රු. 6,01,140 වසරකට
විශේෂ ශ්‍රේණිය - රු. 508,680.00-12 x 15,720.00 = රු. 6,97,320 වසරකට

(*ඇ*) දන්ත වෛද්‍ය නිලධාරීන්ගේ වැටුප් :

2 වැනි ශ්‍රේණිය - රු. 3,06,180 - 4 x 7,740 - 8 x 7,800 = රු. 3,99,540 වසරකට
1 වැනි ශ්‍රේණිය - රු. 4,12,140 - 15 x 12,600 = රු. 6,01,140 වසරකට.

(*ඈ*) අනෙකුත් දීමනා වෛද්‍ය සහ දන්ත වෛද්‍ය ශාඛාවේ නිලධාරින් සඳහා,

(1) *විශ්‍රාම හිමි වැටුප් දීමනා* -

| | | |
|---|---|---|
| ප්‍රාථමික ශ්‍රේණිය | - | රු. 1,700 (මසකට) |
| 2 වැනි ශ්‍රේණිය | - | රු. 1,700 (මසකට) |
| 1 වැනි ශ්‍රේණිය | - | රු. 3,400 (මසකට) |
| විශේෂ ශ්‍රේණිය | - | රු. 3,400 (මසකට) |

(2) *විශ්‍රාම වැටුප් රහිත දීමනා* -

| | | |
|---|---|---|
| ප්‍රාථමික ශ්‍රේණිය | - | රු. 2,125 (මසකට) |
| 2 වැනි ශ්‍රේණිය | - | රු. 1,700 (මසකට) |
| 1 වැනි ශ්‍රේණිය | - | රු. 400 (මසකට) |

(3) අමතර රාජකාරි දීමනාව - රු. 15,000 (මසකට)

(4) *අතිරේක රාජකාරි දීමනාව* -

| | | |
|---|---|---|
| ප්‍රාථමික ශ්‍රේණිය | - | රු. 300 (පැයකට) |
| 2 වැනි ශ්‍රේණිය | - | රු. 325 (පැයකට) |
| 1 වැනි ශ්‍රේණිය | - | රු. 370 (පැයකට) |
| විශේෂ ශ්‍රේණිය | - | රු. 450 (පැයකට) |

(5) (15) (ඉ) ඡේදයේ දැක්වෙන සේවා දීමනා අදාල පරිදි අමතරව ගණනය කරනු ලැබේ.

(*ඉ*) *අනෙකුත් දීමනා :*

(1) ජීවනාධාර දීමනාව මසකට රු. 5,850 ක් ගෙවනු ලැබේ.
(2) සේවා කාලය වසර පහක් සම්පූර්ණ කළ පසු දිරි දීමනා වශයෙන් මසකට රු. 250ක් ගෙවනු ලැබේ.
(3) දුෂ්කර දීමනා මසකට රු. 600ක් ගෙවනු ලැබේ.
(4) ක්‍රියාන්විත සේවයේ සේවය කරන්නන් හට රු. 5,000ක් ගෙවනු ලැබේ.
(5) විශේෂ දීමනාව මසකට රු. 3,000ක් ගෙවනු ලැබේ. (රාජකාරි දිනකට රු. 100 බැගින් ගෙවනු ලැබේ.).
(6) අතිරේක දීමනාව මසකට රු. 1,000 ක් ගෙවනු ලැබේ.
(7) නිල ඇඳුම් නඩත්තු කිරීමේ දීමනාව මසකට රු. 255ක් ගෙවනු ලැබේ.
(8) බැට්මන් දීමනාව මසකට රු. 637.50ක් ගෙවනු ලැබේ. (පිටත වාසය කිරීමට අවසර ලැබූවන් සඳහා).
(9) ආහාර දීමනාව මසකට රු. 13,861.50 ක් ගෙවනු ලැබේ. (පිටත වාසය කිරීමට අවසර ලැබූවන් සඳහා).
(10) සුදුසුකම් වේතනය අදාළ පරිදි (මසකට උපරිමය රු. 637.50ක්) ගෙවනු ලැබේ.
(11) විශේෂ දීමනාවක් ලෙස මසකට මූලික වැටුපෙන් 15% මුදලක් ගෙවනු ලැබේ.
(12) නොමිලේ ගමන් කළ හැකි දුම්රිය බලපත්‍ර කට්ටල තුනක් වසරකට (නිලධාරියාට/බිරිඳ/සහ දරුවන්ට) දෙනු ලැබේ.
(13) කඳවුර තුළ වාසය කරන නිලධාරීන්ට මසකට වරක් නිලධාරි නිවස්නයේ සිට තම නිවාසයට යෑම සහ ඒමට අතිරේක දුම්රිය ගමන් බලපත්‍රයක්, කට්ටලයක් හෝ බස් ගාස්තු ගෙවනු ලැබේ.
(14) නිල ඇඳුම් හා ඊට අදාළ අනෙකුත් භාණ්ඩ නොමිලේ සපයනු ලැබේ.
(15) නොමිලේ වෛද්‍ය පහසුකම් (තම පවුලේ සාමාජිකයන්ට අදාළ පරිදි).
(16) පිටත වාසය කිරීමට බලය දී ඇති විවාහක නිලධාරීන්ට සැතපුම් 30ක් තුළ රාජකාරි ස්ථානයට නොමිලේ ගමන් කිරීම සඳහා මධ්‍යම ගමනාගමන මණ්ඩලයේ බලපත්‍රයක් දෙනු ලැබේ.
(17) රජයේ නිවාසවල වාසය නොකරන විවාහක නිලධාරීන්හට පහත සඳහන් පරිදි නිවාස කුලී දීමනාවක් හිමි වේ. පයිලට් ඔපිසර් සිට ගෲප් කැප්ටන් සහ ඊට ඉහළ නිලයන් සඳහා මසකට රු. 1,850 සිට රු. 4,250 දක්වා.
(18) සේවා දීමනා මාසිකව රු.300, රු.400, රු. 500 සුදුසු පරිදි වේ. (සම්පූර්ණ කරන ලද සේවා කාලයන්ට අනුව වෛද්‍ය සහ දන්ත වෛද්‍ය නිලධාරීන් සඳහා පමණයි).
(19) අමතර සේවා දීමනා මසකට රු. 1,500 (වෛද්‍ය සහ දන්ත වෛද්‍ය නිලධාරීන් සඳහා පමණයි.)
(20) 1/20 දීමනාව මසකට - මූලික වැටුප x 1/20 x උපරිම දින 3 (වෛද්‍ය සහ දන්ත වෛද්‍ය නිලධාරීන් සඳහා පමණයි)

16. *විශ්‍රාම වැටුප් හා පාරිතෝෂික දීමනා.*—විටින් විට සංශෝධනය කරනු ලැබූ සහ 1981 ගුවන් හමුදා විශ්‍රාම වැටුප් හා පාරිතෝෂික දීමනා සංග්‍රහය අනුව විශ්‍රාම වැටුප් පාරිතෝෂික දීමනා ගෙවනු ලැබේ. වැන්දඹු හා අනත්දරු (සන්නද්ධ සේවා) අරමුදලට සියලුම නිලධාරීන් දායකයන් වේ. වැන්දඹු හා අනත්දරු (සන්නද්ධ සේවා) අරමුදලේ දායක මුදල් 1970 රෙගුලාසි අනුවය.

17. *ඉල්ලුම්කරුවන්ට උපදෙස්* :–

(*අ*) පහත දැක්වෙන ආකෘති පත්‍රයට අනුව ඉල්ලුම්පතේ සියලුම කොටු හැකි පමණ විස්තර හා පැහැදිලිව සම්පූර්ණ කළ යුතු ය. ඉල්ලුම්පත් 2012 ඔක්තෝබර් මස 10 වැනි දින මධ්‍යාහ්න 1200ට හෝ ඊට පෙර ලැබෙන සේ "ප්‍රධාන ආධුනිකයින් බඳවා ගැනීමේ

නිලධාරි, ආධුනිකයින් බඳවා ගැනීමේ කාර්යාලය, ශ්‍රී ලංකා ගුවන් හමුදාව, ඒකල, කොටුගොඩ" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. ඉල්ලුම්පත් බහාලන කවරයේ "................... ශාඛාවේ අධිකාරියක් සඳහා ඉල්ලුම්පත" යනුවෙන් සඳහන් විය යුතු ය. ඉල්ලුම්පත් භාරගන්නා අවසාන දිනට හා වේලාවට පසුව සහ මෙම නිවේදනයේ අවශ්‍යතාවයන්ට අනුකූල නොවන ඉල්ලුම්පත් සලකා බලනු නොලැබේ.

(ආ) රාජ්‍ය සේවයේ/සංස්ථා/මණ්ඩල/සිවිල් ආයතනයන්හි සේවයෙහි නිරත වූවන් ස්වකීය ඉල්ලුම්පත් ඒ ඒ දෙපාර්තමේන්තු/ සංස්ථා/මණ්ඩල/සිවිල් ආයතන ප්‍රධානියා මගින් ඉදිරිපත් කළ යුතු ය. යම් හෙයකින් අයදුම්කරු තෝරාගතහොත් තම කාර්යයෙන් නිදහස් කරන බවට සේවා යෝජකයා විසින් ලිපියක් මගින් දැනුම් දිය යුතු ය.

(ඇ) ඉල්ලුම්පත් සමග අයදුම්කරුවන් විසින් පහත සඳහන් සහතිකපත් වල පිටපත් ඉදිරිපත් කළ යුතු ය :

(1) උප්පැන්න සහතිකය;
(2) ලබා ඇති උසස්ම අධ්‍යාපන/වෘත්තීය සුදුසුකම් පිළිබඳ සහතික;
(3) ඉල්ලුම්කරු පෞද්ගලිකව දන්නා වගකිව යුතු පුද්ගලයන් යටත් පිරිසෙයින් දෙදෙනෙකුගෙන් ලබාගත් චරිත සහතික;
(4) ක්‍රීඩා, ශිෂ්‍ය භට පුහුණු ආදී සනාථ කරන සහතික;
(5) ඉල්ලුම්පතේ යම් යම් හිමිකම් කර ඇතොත් ඒවා සනාථ කරන සහතික.

*සැලකිය යුතුයි.-* මෙම සහතිකවල මුල්පිටපත් ඉදිරිපත් කළ යුත්තේ අපේක්ෂකයා සම්මුඛ පරීක්ෂණයකට කැඳවනු ලැබුවහොත් ඒ අවස්ථාවේ දී පමණි.

18. ඉල්ලුම්පතේ අසත්‍ය ප්‍රකාශයක් කර තිබේනම් එම අසත්‍යතාව අපේක්ෂකයා තෝරා ගැනීමට ප්‍රථම හෙළිදරව් වුවහොත් ඔහුගේ/ඇයගේ අපේක්ෂකත්වය අහිමිවීමට ද, තෝරාගනු ලැබීමෙන් පසු හෙළිදරව් වුවහොත් ඔහු/ඇය සේවයෙන් පහකරනු ලැබීමට ද යටත් වේ.

19. *තෝරා ගැනීම, සම්මුඛ පරීක්ෂණ ආදිය :–*

(අ) ඉහත සඳහන් අවශ්‍යතාවයන් සපුරාලන අයදුම්කරුවන් මූලික තේරීම්වලට භාජනය කරනු ලැබේ. එසේ තෝරා ගනු ලබන අයදුම්කරුවන්ට ගුවන් හමුදාධිපති විසින් නියම කරනු ලබන පරිදි පරීක්ෂණවලට හා වෛද්‍ය පරීක්ෂණවලට පෙනී සිටීමට සිදු වන්නේය. රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශය මගින් පත්කරනු ලබන තේරීම් මණ්ඩලයක් ඉදිරිපිට තෝරාගනු ලබන අපේක්ෂකයින් සම්මුඛ පරීක්ෂණයකට භාජනය කිරීමෙන් අවසාන තේරීම කරනු ලැබේ.

(ආ) සම්මුඛ පරීක්ෂණය සඳහා තෝරා ගනු ලබන අපේක්ෂකයින්ට සම්මුඛ පරීක්ෂණය පවත්වනු ලබන ස්ථානය, වේලාව සහ දිනය ලිපියකින් දැනුම් දෙනු ලැබේ. මේ සම්බන්ධයෙන් දරනු ලබන ගමන් වියදම් කිසිවක් ගෙවනු නොලැබේ.

(ඇ) මෙම තනතුර සම්බන්ධයෙන් අයදුම්කරුවෙකු කැඳවනු ලබන සෑම අවස්ථාවකදීම පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පත ඔහු/ඇය විසින් ඉදිරිපත් කළ යුතු ය.

(ඈ) අවසාන සම්මුඛ පරීක්ෂණයට සුදුස්සන් විය හැකි අපේක්ෂකයන් ගුවන් හමුදා වෛද්‍ය මණ්ඩලයක් ඉදිරියේ පෙනී සිටිය යුතු ය.

(ඉ) අපේක්ෂකයකු නිර්දේශ කිරීමට අදහස් කරන කවරෙකු විසින් වුවත්, එසේ කළ යුත්තේ ඔහුට/ඇයට සහතිකයක් දීමෙනි. අපේක්ෂකයෙකු තෝරා ගැනීම සඳහා කවර ආකාරයකින් හෝ පෙළඹවීම නැතහොත් බලපෑම් කිරීමට උත්සාහ දැරීම එම අපේක්ෂකයා නුසුදුස්සෙකු වීමට හේතු වන්නේය.

(ඊ) බඳවා ගැනීම සඳහා සුදුසුකම් නොලබන අපේක්ෂකයින් වෙත ඒ බව දන්වා එවනු නොලැබේ.

එච්. ඩී. අබේවික්‍රම,
එයාර් මාර්ෂල්,
ගුවන් හමුදාධිපති.

මූලස්ථානය,
ශ්‍රී ලංකා ගුවන් හමුදාව,
තැ. පෙ. 594,
කොළඹ.

**ශ්‍රී ලංකා නිත්‍ය/ස්වේච්ඡා ගුවන් හමුදාවේ ............ ශාඛාවේ අධිකාරියක් සඳහා ඉල්ලුම්පත**

1. පුරවැසිභාවය :—————.
(ශ්‍රී ලංකා පුරවැසියෙකු වන්නේ පෙළපතින් ද, ලියාපදිංචි වීමෙන් ද යන්න සඳහන් කරන්න. ලියාපදිංචි කිරීමෙන් නම් එම සහතික පත්‍රයේ දිනය සහ අංකය සඳහන් කරන්න.)

2. සම්පූර්ණ නම (ජාතික හැඳුනුම්පතට අනුව) :—————.

3. ජාතික හැඳුනුම්පත් අංකය :—————.

4. ඉල්ලුම් කරන ශාඛාව :—————.

5. ඉල්ලුම් කරන තනතුර :—————.

6. ස්ථිර ලිපිනය :—————.

7. ස්ථිර ලිපිනයට අයත් පොලිස් ස්ථානය :—————.

8. තැපැල් ලිපිනය :—————.

9. විද්‍යුත් ලිපිනය :—————.

9. උපන් දිනය :—————.

10. උස : අඩි :——— අඟල් :———.

11. දිස්ත්‍රික්කය :—————.

13. ඡන්ද කොට්ඨාසය :―――――.

14. ග්‍රාම සේවක කොට්ඨාසය සහ අංකය :―――――.

15. දුරකථන අංකය :―――――.

16. විවාහක හෝ අවිවාහක බව :―――――.

17. පාසල් සහ/හෝ විශ්වවිද්‍යාල පිළිබඳ විස්තර :

| පාසලේ/ විශ්වවිද්‍යාලයේ නම | සමත් විභාගය | විභාගයට පෙනී සිටි වර්ෂය | සමත් වූ විෂයයන් (ශ්‍රේණි ඇතුළුව) |
|---|---|---|---|
| | අ.පො.ස. (සා.පෙළ) : | | |
| | අ.පො.ස. (උ.පෙළ) : | | |
| | වෘත්තීය සුදුසුකම් : | | |
| | වෙනත් : | | |

18. පාසලෙන්/විශ්වවිද්‍යාලයෙන් ඉවත් වූ පසු කළ රැකියා පිළිබඳ විස්තරː

| සේවා යෝජකයාගේ නම සහ ලිපිනය | රැකියාවේ ස්වභාවය | සේවා කාලය | |
|---|---|---|---|
| | | සිට | දක්වා |
| | | | |

19. මව්පියන් පිළිබඳ විස්තර ඃ-

| සම්පූර්ණ නම | උපන් ස්ථානය | රැකියාව | දැනට ලිපිනය |
|---|---|---|---|
| පියා : | | | |
| මව : | | | |

20. තනතුර සඳහා ඇති විශේෂ සුදුසුකම් :―――――.

21. ක්‍රීඩා අතින් දැනට පවත්නා විශිෂ්ඨතා පිළිබඳ විස්තර ඃ (ඔබ සහභාගි වූ තරඟ සහ ක්‍රීඩා කණ්ඩායම්, දිනයන් හා ලැබූ විශිෂ්ඨතා දක්වන්න.) :―――――.

22. පාසලේ දී, විශ්වවිද්‍යාලයේ දී හෝ බාහිර සංවිධානවල දී දක්වා ඇති වෙනත් විශිෂ්ඨතා (දිනයන් සමග විස්තර දක්වන්න) :――――.

23. සන්නද්ධ සේවා හෝ ස්වේච්ඡා බල සේනාවේ හෝ ශිෂ්‍යභට බලකායේ හෝ බාලදක්ෂ ව්‍යාපාරයේ හෝ ඇති පෙර සේවය :―.

24. ශ්‍රී ලංකා ගුවන් හමුදාවට හෝ සන්නද්ධ හමුදා කිසිවකට හෝ පොලීසියට හෝ බැඳීම සඳහා ඔබ විසින් මීන් පෙර ඉල්ලුම් කර තිබේද ? එසේ නම්, ඒ පිළිබඳ විස්තර සහ ඒ ඉල්ලීම්වලට සිදුවූයේ කුමක්දැයි සඳහන් කරන්න. :―――――.

25. සිවිල් හෝ යුද්ධ උසාවියක දී වැරදිකරු වී හෝ ඇඟ බැඳ තිබේ ද ? එසේ නම් විස්තර සඳහන් කරන්න. :―――――.

26. රජයේ දෙපාර්තමේන්තුවක හෝ රාජ්‍ය අංශයෙහි/ මණ්ඩලයක/ සංස්ථාවක (මහ බැංකු, ජාතික බැංකු, විශ්වවිද්‍යාල, රජය විසින් පාලනය කරන සිවිල් ව්‍යාපාර, සමාගම් ආදිය ඇතුළුව) සේවයෙහි යෙදී සිටියේ නම් එහි සේවය අවසන් කිරීමට හේතු :―――――.

27. චරිත සහතික පිළිබඳ විස්තර :

| නම | පදවිය | තැපැල් ලිපිනය |
|---|---|---|
| | | |

28. අයදුම්කරු විසින් අත්සන් කළ යුතු ප්‍රකාශය :

පූර්වෝක්ත ප්‍රශ්නවලට මා විසින් දී ඇති පිළිතුරු මාගේ දැනීමේ හා විශ්වාසයේ හැටියට සත්‍ය හා නිවැරදි බව අවංකව ප්‍රකාශ කරමි. ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ පළ වූ ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ අධිකාරි සඳහා තෝරාගනු ලබන අපේක්ෂකයින් සම්බන්ධයෙන් අනුගමනය කරන ක්‍රියා පිළිවෙල හා ඒ අයට අදාළ වන ව්‍යවස්ථා ද මම කියවා අවබෝධ කර ගතිමි.

―――――,
ඉල්ලුම්කරුගේ අත්සන.

දිනය :―――――.

10-325

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

## සෞඛ්‍ය අමාත්‍යාංශය

සිසු හෙද පුහුණුවට බඳවා ගැනීම - 2012

සෞඛ්‍ය අමාත්‍යාංශය යටතේ සිසු හෙද පුහුණුව සඳහා බඳවා ගැනීමට පහත සඳහන් සුදුසුකම්ලත් අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. (පිරිමි අයදුම්කරුවන් බඳවා ගැනීම හෙද සේවා ව්‍යවස්ථාවේ විධිවිධාන වලට යටත්ව අමාත්‍යාංශ යටතේ ඇති ආයතනවල අවශ්‍යතා පදනම් කරගනිමින් සිදු කරනු ලැබේ.)

01. අ. පො. ස. (උසස් පෙළ) විභාගයේ දී ලබා ගන්නා ලද Z අගය අනුව කුසලතා ලේඛන සකස් කර දීප ව්‍යාප්ත කුසලතාවය මත 30% ද පළාත් කුසලතාවය මත 70% වන ලෙස සුදුස්සන් තෝරා ගනු ලැබේ. පුහුණු පාඨමාලාවන්ට එම පළාත් වලින් බඳවා ගත හැකි අභ්‍යාසලාභීන් සංඛ්‍යාව එම පළාතේ පවතින රේඛීය අමාත්‍යාංශයට හා පළාත් සභාවට අයත් රෝහල් හා ආයතනවල පවතින පුරප්පාඩු ප්‍රමාණය පදනම් කර ගනිමින් තෝරා ගනු ලැබේ.

එක් පාඨමාලාවක් සඳහා අ. පො. ස. (උ.පෙළ) විභාගයේ Z අගය පදනම් කරගෙන වර්ෂ කිහිපයක උසස් පෙළ සමතුන්ගෙන්

අයදුම්පත් කැඳවා ඇති අවස්ථාවක දී, පුහුණු සඳහා අවශ්‍ය මුළු අභ්‍යාසලාභීන් සංඛ්‍යාව තෝරා ගැනෙනුයේ සියලු වර්ෂවල සුදුසුකම් ලත් මුළු අයදුම්කරුවන්ගේ එකතුවෙන් ඒ ඒ වර්ෂවල සුදුසුකම්ලත් අයදුම්කරුවන්ගේ ප්‍රතිශතයක් වශයෙනි.

02. මෙම පාඨමාලාවන් පූර්ණකාලීන පාඨමාලාවන් වේ. එබැවින් සතියේ දින පහේ සහ සෙනසුරාදා පෙරවරුවේ විශ්ව විද්‍යාලයක හෝ සෞඛ්‍ය අමාත්‍යාංශය යටතේ හෝ වෙනත් රජයේ ආයතනයක හෝ වෙනත් කුමන හෝ පූර්ණකාලීන පාඨමාලාවන් හදාරන සිසුන් මේ සඳහා අයදුම් නොකල යුතු ය. යමෙකු එසේ අයදුම්කර පසු අවස්ථාවක දී හෝ එය අනාවරණය වුවහොත් පාඨමාලාවෙන්/ තනතුරෙන් ඉවත්කර ඒ වන තෙක් රජය විසින් ඔහු/ඇය වෙනුවෙන් දරන ලද සියලුම වියදම් අය කර ගනු ලැබේ. විශ්වවිද්‍යාලයක පූර්ණකාලීන පාඨමාලාවක් හදාරන අයෙකු එසේ අයදුම් කිරීමට අදහස් කරන්නේ නම් ඒ සඳහා පහත දැක්වෙන ආකාරයට ක්‍රියාකල යුතු ය. සෞඛ්‍ය අමාත්‍යාංශය යටතේ පූර්ණකාලීන පුහුණු පාඨමාලාවල ලියාපදිංචි වී සිටින අයගේ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

2.1 කිසියම් දිනක ඔබ කුමන හෝ විශ්ව විද්‍යාලයක හෝ වෙනත් රජයේ ආයතනයක පූර්ණකාලීන පාඨමාලාවක් සඳහා ලියාපදිංචිව සිටියේ නම් හෝ සිටින්නේ නම් 2012.10.28 වැනි දින වන විට ඔබ එම ලියාපදිංචිය අවලංගු කර ගෙන තිබිය යුතු ය. ඔබ විශ්වවිද්‍යාලයක ලියාපදිංචිව සිට දේශන සඳහා සහභාගී නොවූ හෝ සහභාගි නොවන අයෙක් වුව ද ඔබ විශ්වවිද්‍යාල සිසුවෙකු ලෙස සලකනු ලබන බැවින් එවැනි අයදුම්කරුවන් ද තම ලියාපදිංචිය අවලංගු කර ගත යුතු ය. අවශ්‍ය අවස්ථාවල දී එය සනාථ කිරීම පිණිස ප්‍රමාණවත් ලිඛිත සාධක ඔබ සතුව තිබිය යුතු ය.

2.2 ඉහත 2012.10.28 වැනි දින වන විට ඔබ විශ්වවිද්‍යාලයක හෝ සෞඛ්‍ය අමාත්‍යාංශය යටතේ පැවැත්වෙන පාඨමාලාවක හෝ ලියාපදිංචි වී නොසිටි අයෙක් වුව ද යම් හෙයකින් අදාළ පාඨමාලාවට අභ්‍යාසලාභින් බඳවා ගැනීමේ සම්මුඛ පරීක්ෂණ පැවැත්වෙන දින වන විට ලියාපදිංචිව සිටියේ නම් ඔහු/ඇය ද මෙම පාඨමාලාවට නුසුදුස්සකු වන ඇත.

2.3 ඔබ යම් විශ්වවිද්‍යාලයක උපාධියක් සම්පූර්ණ කර සිටින අයෙක් නම් එම උපාධිය බලපැවැත්වෙන දින (Effective Date) අයදුම්පත්භාර ගන්නා අවසාන දිනය හෝ ඊට පෙර දිනයක් විය යුතු ය.

සැළකිය යුතුය :

1 ඉහත 2.1 සිට 2.3 දක්වා සඳහන් කොන්දේසි සියල්ල සම්පූර්ණ කර තිබුන ද අනිවාර්යයෙන්ම ඔබ අයදුම් කරන පාඨමාලාව සඳහා ඇතුළත් කර ගන්නේ ය යන්න මෙම *ගැසට්* නිවේදනයේ කුමන හෝ වගන්තියක් මගින් අදහස් නොකෙරෙන බව ඔබ තරයේ සිහිතබා ගත යුතු ය.

2. එම 2.1 සිට 2.3 දක්වා සඳහන් කොන්දේසි සම්පූර්ණ කර තිබුන ද ඔබ සුදුසුකම් ලැබීමට ප්‍රමාණවත් Z අගයක් ලබා නොමැතිනම් හෝ මෙහි සඳහන් අනෙකුත් කුමන හෝ කොන්දේසියක් සම්පූර්ණ කර නොමැතිනම් කිසිදු අයුරකින් මෙම පාඨමාලාවන් සඳහා සුදුසුකම් නොලබන බව ඔබ දැනගත යුතු ය.

3. එමෙන්ම ඔබ ප්‍රමාණවත් Zඅගයක් ලබා මෙහි සඳහන් අනෙකුත් කොන්දේසි සියල්ල සම්පූර්ණ කර තිබුන ද 2.1 සිට 2.3 දක්වා සඳහන් කොන්දේසි සඳහන් කර නොමැති නම් කිසිදු අයුරකින් මෙම පාඨමාලාවන් සඳහා සුදුසුකම් නොලබන බව ඔබ තවදුරටත් දැනගත යුතු ය.

03. *අධ්‍යාපන සුදුසුකම් :*

(අ) 2009, 2010 සහ 2011 වර්ෂයන්හි අ. පො. ස. (උ. පෙළ) විභාගයේ දී විද්‍යා විෂයය ධාරාවට අයත්, ජීව විද්‍යාව/ගණිතය/කෘෂි විද්‍යාව විෂයය ධාරාවෙන් සියලුම විෂයයන්ගෙන් (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) එකවර සමත් වීම;

සහ

(ආ) සිංහල/දෙමළ භාෂාව, ගණිතය, විද්‍යාව හා ඉංග්‍රීසි යන විෂයයන් 04ට සම්මාන සාමාර්ථ සහිතව දෙවරකට නොවැඩි වාර ගණනක දී විෂයයන් හයකින් (06) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත්ව තිබීම.

අධ්‍යාපන සුදුසුකම් සනාථ කිරීම සඳහා ඉහත විභාග දෙකෙහි සහතිකවල සහතික කල ඡායා පිටපත් අමුණා එවිය යුතු ය.

04. *අනෙකුත් සුදුසුකම් :*

(අ) ශ්‍රී ලාංකික පුරවැසියකු විය යුතු ය.

(ආ) පුහුණුවෙන් පසු පුහුණුව සඳහා බඳවා ගන්නා ලද පළාත තුළ අවම වශයෙන් වසර 10වත් සේවය කල යුතු ය.

(ඇ) 2012.10.28 වැනි දිනට වයස අවුරුදු 18 නොඅඩු වයස අවුරුදු 28ට නොවැඩි විය යුතු ය.

(ඈ) උස අඩි 04 අඟල් 10ට නොඅඩු විය යුතු ය.

(ඉ) අවිවාහක විය යුතු ය.

(ඊ) දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට කැමති වීම හා මනා ශාරීරික සෞඛ්‍යයකින් යුක්ත විය යුතු ය.

(උ) තමන් අයදුම් කරන දිස්ත්‍රික්කය තුළ අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට පූර්වාසන්න වසර 03ක් අඛණ්ඩව පදිංචිව සිටිය යුතු ය. පදිංචිය සනාථ කිරීමට පහත කරුණු වලින් එකක් සපුරා තිබිය යුතු ය.

(i) අපේක්ෂාකයා අදාළ දිස්ත්‍රික්කය තුල උපන් අයෙකු වීම.

(ii) *ගැසට්* පත්‍රයේ සඳහන් දිනට පූර්වාසන්න වසර 05ක් තුළ ඔහු එම දිස්ත්‍රික්කය තුළ අවුරුදු 03ක් වත් අඛණ්ඩව පදිංචි වී සිටිය යුතු ය. (මෙහි දී ප්‍රාදේශීය ලේකම් අනු අත්සන් කල ග්‍රාම නිලධාරි සහතිකය හෝ පූර්වාසන්න වසර 03ක ඡන්දහිමි නාමලේඛනය ඉදිරිපත් කල යුතු ය)

(iii) නොකඩවා අවුරුදු 05ක් එම අදාළ දිස්ත්‍රික්කයේ ද්විතික පාසල් අධ්‍යාපනය ලබා තිබිය යුතු ය.

***සටහන.***-යම් අපේක්ෂකයෙකුගේ පියා හෝ මව හෝ රජයේ, පළාත් සභා සේවයේ හෝ සංස්ථාවක මාරු කල හැකි සේවයක යෙදී සිටියේ නම් එම අපේක්ෂකයාට තම මවගේ හෝ පියාගේ හෝ උපන් දිස්ත්‍රික්කය තමා අයත් දිස්ත්‍රික්කය ලෙස තෝරා ගත හැක. (මවගේ හෝ පියාගේ උප්පැන්න සහතිකය ඉදිරිපත් කල යුතු ය).

05. *අයදුම් කළ යුතු ක්‍රමය* :

(අ) මෙම නිවේදනය අග දක්වා ඇති ආදර්ශ ආකෘතිය අනුව ඒ4 ප්‍රමාණයේ කඩදාසියක දෙපිටම ප්‍රයෝජනයට ගනිමින් අයදුම්පත් සකස් කළ යුතු වේ;

ආදර්ශ අයදුම්පතේ දක්වා ඇති අංක 01 සිට අංක 09 දක්වා වගන්ති 01 පිටුවේ ද අංක 10 වගන්තිය 02 වන පිටුවේ ද අංක 11 සිට අංක 13 දක්වා වගන්ති 03 වන පිටුවේ ද වන පරිදි අයදුම්පත් සකස් කළ යුතු වේ.

(ආ) නිසි පරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පත් කවරයකට බහා එම කවරයේ ඉහත වම් කෙලවරේ "සිසු හෙද හෙදියන් පුහුණුවට බඳවා ගැනීම - 2012" වශයෙන් සඳහන් කොට 2012.10.28 වැනි දිනට පෙර ඔබ "ස්ථිර පදිංචි පළාතේ, "පළාත් සෞඛ්‍ය ලේකම්" වෙත ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. එක් එක් පළාත් සභාවන්ට අයත් සෞඛ්‍ය ලේකම්වරුන්ගේ ලිපිනයන් පහතින් දක්වා ඇත ;

01. ලේකම්, බස්නාහිර පළාත් සෞඛ්‍ය අමාත්‍යාංශය, නිදහස් චතුරශ්‍රය, කොළඹ 07.
02. ලේකම්, මධ්‍යම පළාත් සෞඛ්‍ය අමාත්‍යාංශය, තැ. පෙ. 121, සංඝරාජ මාවත, මහනුවර.
03. ලේකම්, ඌව පළාත් සෞඛ්‍ය අමාත්‍යාංශය, අංක 301, ආර්. එච්. ගුණවර්ධන මාවත, බදුල්ල.
04. ලේකම්, වයඹ පළාත් සෞඛ්‍ය අමාත්‍යාංශය, 3 වන මහල, පළාත් සභා සංකීර්ණය, කුරුණෑගල.
05. ලේකම්, උතුරු මැද පළාත් සෞඛ්‍ය අමාත්‍යාංශය, ධර්මපාල මාවත, අනුරාධපුරය.
06. ලේකම්, දකුණු පළාත් සෞඛ්‍ය අමාත්‍යාංශය, පහල ඩික්සන් පාර, ගාල්ල.
07. ලේකම්, සබරගමු පළාත් සෞඛ්‍ය අමාත්‍යාංශය, නව නගරය, රත්නපුර.
08. ලේකම්, නැගෙනහිර පළාත් සෞඛ්‍ය අමාත්‍යාංශය, ඇතුල් වරාය පාර, ත්‍රිකුණාමලය.
09. ලේකම්, උතුරු පළාත් සෞඛ්‍ය අමාත්‍යංශය, සෞඛ්‍ය ගම්මානය, පන්නයි, යාපනය.

ශ්‍රී ලංකා පරිපාලනය සේවයේ/අධ්‍යාපන පරිපාලන සේවයේ/රජයේ ගණකාධිකාරි සේවයේ/රජයේ විදුහලක විදුහල්පතිවරයෙකු/සාමදාන විනිශ්චයකාරවරයෙකු/ නීතිඥවරයෙකු හෝ වාර්ෂිකව රු. 240360 නොඅඩු ආරම්භක වැටුපක් සහිත තනතුරක් දරන රජයේ නිලධාරියෙකු විසින් අයදුම්පතේ අපේක්ෂකයාගේ අත්සන සහතික කළ යුතු වේ.

(ඇ) අයදුම්පතේ සඳහන් මුද්දර කොටුවේ රු. 300 මුද්දර අලවා තම අත්සන යොදා අවලංගු කල යුතු ය.

06. රජයේ හෝ අර්ධ රාජ්‍ය ආයතනවල සේවකයින්ගේ අයදුම්පත් ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් එවිය යුතු ය. එමෙන්ම මෙය බාහිර බඳවා ගැනීමක් බව සිහි තබා ගත යුතු ය.

07. ඉහත සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන්/අයදුම්කාරියන් අතරින් Z අගය අනුව සකස් කරනු ලබන ප්‍රමුඛතා ලේඛනයක් පදනම් කරගෙන තෝරාගත් පිරිස පමණක් සෞඛ්‍ය අමාත්‍යාංශයේ හා පළාත් සේවාවන්හි මාණ්ඩලික නිලධාරින්ගේ නියෝජනයන් යුතු සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබේ. සම්මුඛ පරීක්ෂණයේ දී අයදුම්කරුවන්/ අයදුම්කාරියන් විසින් පහත සඳහන් ලිපිලේඛන වල මුල් පිටපත් ඉදිරිපත් කල යුතු ය.

(අ) උප්පැන්න සහතිකය;

(ආ) අ. පො. ස. (උසස් පෙළ) විභාග ප්‍රතිඵල හා Z අගය දැක්වෙන සහතිකයේ මුල් පිටපත (මෙහි සහතික කල පිටපතක් අයදුම්පත සමග අමුණා එවිය යුතු ය).

(ඇ) අ. පො. ස. (සා/පෙළ) විභාග ප්‍රතිඵල දැක්වෙන සහතිකයේ මුල් පිටපත. (මෙහි සහතික කල පිටපතක් අයදුම්පත සමග අමුණා එවිය යුතු ය)

(ඈ) ජාතික හැඳුනුම්පත හෝ වලංගු විදේශ ගමන් බලපත්‍රය හෝ වලංගු රියදුරු බලපත්‍රය (මෙහි සහතික කල පිටපතක් අයදුම්පත්‍රය සමග අමුණා එවිය යුතු ය.)

(ඉ) ඉහත 4 (උ) අනුව පදිංචිය සනාථ කිරීම සඳහා ප්‍රාදේශීය ලේකම් විසින් අනු අත්සන් කරන ලද ග්‍රාම නිලධාරි විසින් නිකුත් කරන ලද පදිංචිය පිළිබඳ සහතිකය (ග්‍රාම නිලධාරි සහතිකය හෝ පූර්වාසන්න වසර 03ක ඡන්ද හිමි නාම ලේඛනවල සහතික කරන ලද පිටපතක්)

(ඊ) අවිවාහක බව සනාථ කිරීම සඳහා සාමදාන විනිශ්චයකරුවකු ඉදිරියේ අත්සන් කරන ලද දිවුරුම් ප්‍රකාශයක්.

08. *පුහුණු කිරීමේ පරිපාටිය* :

(අ) තෝරාගත් අයදුම්කරුවන් සිදු හෙද/හෙදියන් වශයෙන් හෙද පුහුණු පාසැල්වලට ඇතුළත් කරනු ලබන අතර, ඔවුන් විසින් අවුරුදු 03 ක පුහුණුවීමේ පාඨමාලාවක් හැදෑරිය යුතු වේ.

(ආ) පුහුණුව සඳහා ඇතුළත් කරන අවස්ථාවේ අභ්‍යාසලාභීන් වෙත හෙද පුහුණු පාසැල්වල බලපැවැත්වෙන නීතිරීති මාලාවක් සපයනු ලැබේ. මෙම නීතිරීතිවලට හා කලින් කල පනවනු ලබන වෙනත් නීතිරීතිවලට ද ඔවුන් යටත් වනු ඇත.

(ඇ) පුහුණුව ලබන කාල පරිච්ඡේදය තුළ නියමිත විභාගවලින් අසමත් වන හෝ වැඩ හා හැසිරීම අසතුටුදායක වන හෝ විභාග හා නිවාඩු කොන්දේසි පිළිපැදීමට අපොහොසත් වන හෝ පුහුණුවට බඳවා ගැනීම සඳහා ඉදිරිපත් කර ඇති අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් අසත්‍ය බවට හෙළිවුවහොත් අභ්‍යාසලාභීන්ගේ පුහුණුව ඕනෑම අවස්ථාවක දී වන්දි ගෙවීමකින් තොරව නතර කිරීමට හැකිය. පුහුණු කාලය තුළදී අභ්‍යාසලාභීන් කිසිම ආකාරයක නිවාඩුවකට හිමිකම් නොලබන අතර පුහුණුව සඳහා නොපැමිණෙන දින වෙනුවෙන් දීමනාවෙන් සමානුපාතික මුදලක් අඩු කරනු ලැබේ. කෙසේ වෙතත් විභාගයට පෙනී සිටීම සඳහා සෑම වර්ෂයකම 80%ක පැමිණීම අනිවාර්ය වේ.

(ඈ) හෙද විදුහලක පුහුණුව ලබන කාල පරිච්ඡේදය තුළ අභ්‍යාසලාභීන්ට පහත සඳහන් පරිදි දීමනාවක් ගෙවනු ලැබේ.

1. පළමු අවුරුද්ද - මාසිකව රු. 12,920
2. දෙවන අවුරුද්ද - මාසිකව රු. 13,040
3. තෙවන අවුරුද්ද - මාසිකව රු. 13,160

පුහුණුව සාර්ථක ලෙස සම්පූර්ණ කිරීමෙන් අනතුරුව අවසාන විභාගයෙන් සමත්වන අභ්‍යාසලාභීන් III ශ්‍රේණියේ මාණ්ඩලික

හෙද තනතුරට අදාළ වැටුප් පරිමාණය මත තනතුරුවල පුරප්පාඩු ඇතිවන පරිදි සෞඛ්‍ය ලේකම් විසින් පත්වීම් දෙනු ලැබේ.

(ඉ) පුහුණු ලබන කාලය තුළ පුහුණුවෙන් ඉවත්වුවහොත් හෝ ඉවත්කළහොත් හෝ පුහුණුව හැර ගියහොත් පුහුණු කාලය තුල දී ඔහුට/ඇයට ගෙවන ලද දීමනා හා රජය විසින් පුහුණුව සඳහා දරන ලද වියදම් සඳහා වැය වූ මුදල ඔහු හෝ ඇය විසින් දෙපාර්තමේන්තුවට ගෙවිය යුතු වේ. එසේ නොවුවහොත් එම මුදල අයකර ගැනීමට නිසි පියවර ගනු ඇත.

09. *විවාහ නොවීමේ කොන්දේසි හා ගිවිසුම :*

(අ) සියලුම අයදුම්කරුවන් ඉල්ලුම් පත්‍ර එවන දිනය වන විට අවිවාහකව සිටිය යුතු අතර, පුහුණුව ලබන කාලය තුළ දී ද අවිවාහකව සිටීම අනිවාර්ය වේ. අවිවාහක බව සනාථ කිරීම සඳහා සියලුම අයදුම්කරුවන් විසින් සාමදාන විනිශ්වයකාරවරයෙකු ඉදිරියේ දී අත්සන් තබන ලද දිව්රුම් ප්‍රකාශයක් සම්මුඛ පරීක්ෂණයේදී ඉදිරිපත් කළ යුතු වේ.

(ආ) සිසු හෙද/හෙදියන් හෙද පුහුණු පාසලට ඇතුලත් වන අවස්ථාවේ දී පුහුණුව සාර්ථකව නිම කරන බවටත්, එකී පුහුණුව සම්පූර්ණ කිරීමෙන් පසුව අවම වශයෙන් අවුරුදු 10ක කාල පරිච්ඡේදයක් සෞඛ්‍ය අමාත්‍යාංශය හෝ පළාත් සෞඛ්‍ය අමාත්‍යාංශයක් යටතේ ඇති රෝහලක සේවය කරන බවටත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල් සමග ගිවිසුමකට එළඹිය යුතු ය. සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් මෙම කාල පරිච්ඡේදය කලින් කලට නිශ්චය කරනු ඇත.

10. *සේවයෙහි නියුක්ත කරවීමේ නියමයන් :*

(අ) පුහුණුව අවසානයේ ස්ථිර පත්වීම් ප්‍රදානය කිරීමට රජය බැඳී නොසිටී. එහෙත් අපේක්ෂක අපේක්ෂිකාවන් තමන් පුහුණුවට බඳවා ගත් පාඨමාලාවට අදාල බඳවා ගැනීමේ පරිපාටියේ කොන්දේසි හා පළාතේ පවත්නා පුරප්පාඩු මත අදාල තනතුරේ III පංතියේ මාණ්ඩලික හෙද/හෙදි නිලධාරි තනතුරට පත්කිරීම සඳහා සලකා බලනු ලැබේ. මුල් පත්වීමේ සිට වසර 10යන තෙක් මුල් පත්වීම ලබන සේවා ස්ථානයේ සේවය කිරීම අනිවාර්ය වේ.

එක් එක් පාඨමාලාවන් අවසානයේ දී පැවැත්වෙන අවසන් ලිඛිත පරීක්ෂණයේ ප්‍රතිඵල මත සකස් කරනු ලබන කුසලතා ලේඛනය පදනම් කරගෙන සහ ඉහත පළාත් මට්ටමේ බඳවා ගනු ලැබූ 70% ප්‍රතිශතය හා දීප ව්‍යාප්ත කුසලතාවය මත බඳවා ගනු ලැබූ 30% ක ප්‍රතිශතය ද සැලකිල්ලට ගෙන පුරප්පාඩු පවතින ආයතන වෙත පත්වීම් ලබා දීමට සලකා බැලීම සිදු කෙරේ.

(ආ) ඉහත පරිදි පුහුණුවෙන් පසුව පැවැත්වෙන අවසන් විභාගයේ ප්‍රතිඵල මත පත් කරනු ලබන III ශ්‍රේණියේ මාණ්ඩලික හෙද තනතුර විශ්‍රාම වැටුප් සහිතවන අතර, වැන්දඹු හා අනත්දරු/වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට දායක මුදල් ගෙවිය යුතු ය.

(ඇ) III ශ්‍රේණියේ මාණ්ඩලික හෙද තනතුරුවලට පත්කරනු ලබන්නේ අවුරුදු 03ක පරිවාස කාලයකට යටත්ව ය.

11. *සේවා කොන්දේසි :*

(අ) සියළුම අභ්‍යාසලාභීන් පුහුණුව ආරම්භ කිරීමට පෙර වෛද්‍ය පරීක්ෂණයකට පෙනී සිටීම අවශ්‍ය වේ.

(ආ) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 6/2006(iv)හි එම් ටී 7-2006 "A" පරිදි රු. 15,620-4x180-6x240-11x320-20x360-රු. 28,500 වැටුප් පරිමාණය මත හෙද නිලධාරින් III ශ්‍රේණියේ මාණ්ඩලික හෙද තනතුරුවල පවත්නා පුරප්පාඩු සඳහා පත්කරනු ලැබේ.

(ඇ) හෙද සේවයේ සියලුම නිලධාරීන් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ විධිවිධානයන්ට, රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් රජයේ සේවය සම්බන්ධව පනවන ලද රීති, රෙගුලාසි හා නියෝගවලට, හෙද සේවා ව්‍යවස්ථාවේ විධිවිධානවලට, රජයේ මුදල් රෙගුලාසිවලට, රජයේ වෙනත් රෙගුලාසි, චක්‍රලේඛ හා උපදෙස්වලට හා ඒවාට අදාළව වරින්වර නිකුත් කරනු ලබන සංශෝධනවලටද යටත්වනු ඇත.

(ඈ) අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් පිළිබඳ විස්තර අයදුම්පත් පිරවීමේ දී ඉතා සැලකිලිමත්ව හා නිවැරදිව ඇතුලත් කල යුතු ය. පුහුණුව සඳහා බඳවා ගැනීමෙන් හෝ පත්වීම් ලැබීමෙන් පසු යට කී සහතික ව්‍යාජ බවට ඔප්පු වුවහොත්, නීත්‍යානුකූලව කටයුතු කිරීම සඳහා අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව වෙත යොමු කිරීමටත්, ඒ දෙනු ලබන පත්වීම් අවලංගු කර/පුහුණුවෙන්/තනතුරෙන් පහ කරන අතර ඒ සම්බන්ධයෙන් විනයානුකූලව කටයුතු කර නැවත රජයේ සේවයට නොගන්නවුන්ගේ අසාධු ලේඛනයට ඔහුගේ/ඇයගේ නම ඇතුලත් කිරීමටත් කටයුතු කරනු ලැබේ. තව ද පුහුණු කාලය තුළ දී ඔහුට/ඇයට ගෙවන ලද දීමනාව, රජය විසින් දරන ලද වියහියදම් හා ඇපකරයට අදාල මුදල ඔහුගෙන්/ඇයගෙන් අයකර ගැනීමට කටයුතු කරනු ලැබේ.

(ඉ) පුහුණුවට බඳවා ගනු ලබන අයදුම්කරුවන් සඳහා පුහුණු පාසල් වල නේවාසික පහසුකම් සැපයීමට මෙම අමාත්‍යාංශ බැඳී නොසිටී.

(ඊ) මෙම පුහුණු කාල සීමාව තුළ දී වෘත්තීය සමිති කටයුතුවල යෙදීම හෝ පෞද්ගලික සේවයේ යෙදීමට හෝ කිසිම අයිතිවාසිකමක් නොමැත. එසේම පුහුණුවෙන් පසුව ඔබ අදාල තනතුරේ පත්වීම් ලදහොත් ඉන්පසුව ද පෞද්ගලික සේවයේ යෙදීමට ඔබට කිසිදු අයිතිවාසිකමක් නොමැත. එවැන්නක් සිදු කර අනාවරණය වුවහොත් නීත්‍යානුකූලව කටයුතු කිරීමට පියවර ගනු ලැබේ.

(උ) පුහුණුවට බඳවා ගැනීම සම්බන්ධයෙන් මෙම ගැසට් නිවේදනය මගින් ආවරණය නොවන යම් ගැටළු සහගත කරුණක් උද්ගත වුවහොත්, ඒ පිළිබඳව සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලේකම්ගේ තීරණය අවසන් තීරණය වේ. මෙම ගැසට් නිවේදනයේ සිංහල/දෙමළ හා ඉංග්‍රීසි පාඨ අතර යම් පරස්පරතාවයක් ඇතිවුවහොත් එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු වන්නේ ය.

වෛද්‍ය වයි. ඩී. නිහාල් ජයතිලක,
ලේකම්,
සෞඛ්‍ය අමාත්‍යාංශය.

2012 සැප්තැම්බර් මස 17 වැනි දින,
සෞඛ්‍ය අමාත්‍යාංශය,
"සුවසිරිපාය",
අංක 385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත,
කොළඹ 10.

**සෞඛ්‍ය අමාත්‍යාංශය**

***සිසු හෙද පුහුණුවට බඳවා ගැනීම - 2012***

01. (අ) මුලකුරු සමග අගට යෙදෙන නම (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) :————.

(ආ) සම්පූර්ණ නම (සිංහලෙන්) :————.

02. තැපැල් ලිපිනය (ඉංග්‍රීසියෙන්) :————.

03. (i) ස්ථිර ලිපිනය : (සිංහලෙන්)

| |
|---|
| |

(ii) දිස්ත්‍රික්කය (ඉංග්‍රීසියෙන්)

| |
|---|
| |

(iii) දුරකථන අංකය : ජංගම

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | |

ස්ථාවර

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | |

04. උපන් දිනය : වර්ෂය 19 :————. මාසය :————. දිනය :————.

05. 2012.10.28 වැනි දිනට වයස :————. අවු. :————. මාස :————. දින :————.

06. ස්ත්‍රී/පුරුෂ භාවය :

| | |
|---|---|
| පුරුෂ | |
| ස්ත්‍රී | |

අදාළ කොටුවේ ✓ ලකුණ යොදන්න.

07. ඔබ ශ්‍රී ලංකාවේ පුරවැසියෙක් ද යන වග :

| | |
|---|---|
| ඔව් | |
| නැත | |

අදාළ කොටුවේ ✓ ලකුණ යොදන්න.

08. ජාතික හැඳුනුම්පත් අංකය

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | |

09. උස : අඩි :————. අඟල් :————.

10. (අ) අධ්‍යාපන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය (ලකුණු සටහන් පිටපත් ද අමුණන්න.)

(1) වර්ෂය :————. විභාග අංකය :————. Z අගය :————.

| විෂයය | ශ්‍රේණිය | කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා | විෂයය | ශ්‍රේණිය | කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා |
|---|---|---|---|---|---|
| 1. | | | 3. | | |
| 2. | | | 4. | | |

(ආ) අ. පො. ස. (සා. පෙළ) විභාගය

පළමු වාරය :

(i) විභාගයේ වර්ෂය හා මාසය :————.

(ii) විභාග අංකය :————.

| විෂයය | ශ්‍රේණිය | කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා | විෂයය | ශ්‍රේණිය | කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා |
|---|---|---|---|---|---|
| 1. ගණිතය | | | 7. | | |
| 2. විද්‍යාව | | | 8. | | |
| 3. සිංහල | | | 9. | | |
| 4. ඉංග්‍රීසි | | | 10. | | |
| 5. | | | 11. | | |
| 6. | | | 12. | | |

දෙවැනි වාරය :

(i) විභාගයේ වර්ෂය හා මාසය :————.
(ii) විභාග අංකය :————.

| විෂයය | ශ්‍රේණිය | කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා | විෂයය | ශ්‍රේණිය | කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා |
|---|---|---|---|---|---|
| 1. | | | 7. | | |
| 2. | | | 8. | | |
| 3. | | | 9. | | |
| 4. | | | 10. | | |
| 5. | | | 11. | | |
| 6. | | | 12. | | |

11. උසාවියක් ඉදිරියේ ඔබ කිසියම් චෝදනාවකට වැරදිකරු වී ඇත් ද?

| | |
|---|---|
| | ඔව් |
| | නැත |

ඔව් නම් විස්තර සපයන්න. :————.

12. අයදුම්කරුගේ සහතිකය :

(අ) මෙම අයදුම්පතෙහි මා විසින් සපයා ඇති තොරතුරු මා දන්නා තරමින් සත්‍ය හා නිවැරදි බව ගෞරවයෙන් ප්‍රකාශ කර සිටිමි.

(ආ) මා විසින් කරනු ලැබ ඇති මෙම ප්‍රකාශය අසත්‍ය බව ඔප්පු වුවහොත් සේවයෙන් පහ කරනු ලැබීමට යටත් වන බව මම දැන සිටිමි.

| |
|---|
| රු. 300 වටිනාකමක් සහිත මුද්දර අලවා අත්සන යොදා අවලංගු කළ යුතු ය. |

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

13. *අයදුම්කරුගේ අත්සන සහතික කිරීම :*

මෙම අයදුම්පත ඉදිරිපත් කරන ..................... මා පෞද්ගලිකව හඳුනන බවත් ඔහු/ඇය 2012 ............ වැනි දින මා ඉදිරිපිට දී ඔහුගේ/ඇයගේ අත්සන තැබූ බවත් සහතික කරමි.

—————,
සහතික කරන්නාගේ අත්සන.

සහතික කරන නිලධාරියාගේ,
සම්පූර්ණ නම :—————.
තනතුර :—————.
ලිපිනය :—————.
දිනය :—————.

10-230

---

**රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය**

ග්‍රාම නිලධාරි III වැනි ශ්‍රේණියට බඳවා ගැනීමේ තරග විභාගය - 2012

දිවයින පුරා ඇති ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල පුරප්පාඩු පවතින ග්‍රාම නිලධාරි කොට්ඨාසවලට ග්‍රාම නිලධාරීන් පත් කිරීම සඳහා සුදුස්සන් තෝරා ගැනීම පිණිස පවත්වනු ලබන ලිඛිත පරීක්ෂණයට පෙනී සිටීම සඳහා පහත සඳහන් සුදුසුකම් ඇති ස්ත්‍රී/පුරුෂ දෙපක්ෂයෙන් ඇයදුම්පත්‍ර කැඳවනු ලැබේ.

02. ඇයදුම්කරුවෙකුට 06 වගන්තියෙහි සඳහන් විධිවිධාන අනුව සුදුසුකම් ලබන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පවත්නා පුරප්පාඩු සඳහා ඉල්ලුම් කළ හැකිය.

03. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස හා අයත් දිස්ත්‍රික්ක පිළබඳ තොරතුරු I වැනි උපලේඛනයේ දැක්වේ. අයදුම්කරුවන් තමා ඉල්ලුම් කරන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය හා එහි අංකයත්, දිස්ත්‍රික්කයේ නම හා අංකයත් එම උපලේඛනයේ සඳහන් පරිදි නිවැරදිව අයදුම්පත්‍රයේ නියමිත ස්ථානයේ සඳහන් කළ යුතු ය. එය පසු අවස්ථාවක වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ. එම විස්තර වැරදි ලෙස සටහන් කිරීම හේතුවෙන් අයදුම්කරුවකුට සිදුවන කිසියම් අවාසියක් සම්බන්ධ කිසිදු ඉල්ලීමක් සලකා නොබලන අතර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය හා කොට්ඨාස අංකය සඳහන් කර නොමැති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

04. *තරග විභාගය පිළිබඳ විස්තර :*

4.1 විභාග මාධ්‍යය : මෙම විභාගය සිංහල/දෙමළ/ඉංග්‍රීසි යන භාෂා මාධ්‍යවලින් පවත්වනු ඇත. අපේක්ෂකයින් එක් භාෂා මාධ්‍යකින් පමණක් පෙනී සිටිය යුතු ය. ඉල්ලුම් කරන භාෂා මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩ ලබා දෙනු නොලැබේ.

4.2 ග්‍රාම නිලධාරීන් බඳවා ගැනීමේ විභාගය, පහත සඳහන් ප්‍රශ්න පත්‍ර 02කින් සමන්විත වේ.

| | | *කාලය* | *ලකුණු* |
|---|---|---|---|
| 4.2.1. | භාෂා හැකියාව | පැය 1 1/2 යි. | 100 |
| 4.2.2. | සාමාන්‍ය දැනීම හා අභියෝග්‍යතාව | පැය 1 1/2යි | 100 |

4.3 *විෂය නිර්දේශය :*

4.3.1. භාෂා හැකියාව : මෙම ප්‍රශ්න පත්‍රය අපේක්ෂකයන්ගේ අදහස් ප්‍රකාශනය, අවබෝධය, අක්ෂර වින්‍යාසය, භාෂාව හා රචනය, දෙන ලද ලිපියක් කෙටුම්පත් කිරීම, සපයා ඇති දත්ත අනුව ප්‍රස්ථාර, වගු සකස් කිරීම, දී ඇති පාඨ සාරාංශ කිරීම, දී ඇති වාක්‍ය කීපයක අදහස තනි වාක්‍යයකින් ලිවීම සහ සරල ව්‍යාකරණ භාවිතය පිළිබඳ දනුම පරීක්ෂා කෙරෙන විෂයානුබද්ධ ප්‍රශ්නවලින් සමන්විත වේ. සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සැපයිය යුතු ය.

4.3.2. සාමාන්‍ය දැනීම හා අභියෝග්‍යතාව : මෙම ප්‍රශ්න පත්‍රය මගින් රටෙහි ඓතිහාසික, භූගෝලීය, සාමාජීය හා ආර්ථික වශයෙන් වැදගත්වන තොරතුරු හා දේශීය හා විදේශීය කාලීන තොරතුරු පිළිබඳව සාමාන්‍ය දැනීම සහ සංඛ්‍යාමය හැකියාවන්, තර්කන ශක්තිය, ගැටලු නිරාකරණය, තීරණ ගැනීමේ හැකියාව ඇතුළු සාමාන්‍ය බුද්ධිය මැනෙන අයුරින් සැකසෙන විෂයානුබද්ධ ප්‍රශ්න වලින් සමන්විත වේ. සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සැපයිය යුතු ය.

4.4 ලිඛිත පරීක්ෂණයෙන් වැඩිම ලකුණු ලබා ගැනීමේ අනුපිළිවෙල අනුව අයදුම්කරුවන් ප්‍රමුඛතාගත කිරීමේ දී එක් එක් විෂයයන්ට 40% ක් හෝ ඊට වැඩියෙන් ලකුණු ලබා ඇති අයදුම්කරුවන් පමණක් සැලකිල්ලට ගනු ලැබේ.

05. *බඳවා ගැනීමේ ක්‍රමය :*

(i) ලිඛිත විභාගයෙන් එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් වැඩිම ලකුණු ලබා ඇති අයදුම්කරුවන් අතරින් එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පුරප්පාඩු සංඛ්‍යාව මෙන් දෙගුණයක අයදුම්කරුවන් සංඛ්‍යාවක් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයකට කැඳවනු ලැබේ. ලිඛිත විභාගයේ සහ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ දී ලබා ගන්නා ලකුණුවල එකතුවෙන් වැඩිම ලකුණු ලබා සුදුසුකම් ලබන අයදුම්කරුවන් එම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පුරප්පාඩු සංඛ්‍යාව පිරවීම සඳහා පුහුණු පාඨමාලාවකට තෝරාගනු ලැබේ.

(ii) ඉහත 05. I ඡේදයේ සඳහන් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය සඳහා පහත සඳහන් ආකාරයට ලකුණු ලබාදෙනු ඇත.

(අ)

| *ලකුණු ලබාදෙනු ලබන ශීර්ෂ* | *උපරිම ලකුණු ප්‍රමාණය* |
|---|---|
| නායකත්වය | 20 |
| ක්‍රීඩා කුසලතා | 10 |
| භාෂා ප්‍රවීණතාවය (මව් භාෂාව හැර අනෙක් භාෂා ප්‍රවීණතාවන්ට) | 10 |
| පරිගණක දැනුම | 05 |
| සම්මුඛ පරීක්ෂණයේ දී දක්වනු ලබන කුසලතා | 05 |
| එකතුව | 50 |

(ආ) ලකුණු ලබාදීමේ දී සලකා බලනු ලබන්නේ රාජ්‍ය ආයතනයකින්/ දෙපාර්තමේන්තුවකින් විධිමත්ව නිකුත් කරන ලද සහතික සහ අදාළ කරුණ සනාථ කිරීම සම්බන්ධයෙන් වගකීම පැවරෙන රජයේ දෙපාර්තමේන්තු, ආයතනවල මාණ්ඩලික මට්ටමේ නිලධාරීන් නිකුත් කරන ලද සනාථ කිරීමේ ලිපි පමණි. උදාහරණ වශයෙන් දහම් පාසල් ගුරුවරයෙකු ලෙස කටයුතු කිරීම, ග්‍රාම සංවර්ධන සමිතියක නිලතල දැරීම, ක්‍රීඩා සමාජයක නිලතල දැරීම වැනි කරුණු ප්‍රාදේශීය ලේකම් විසින් සනාථ කළ යුතු ය.

(ඇ) ග්‍රාම නිලධාරීන්ට දේශපාලන අයිතිවාසිකම් නොමැති බැවින් දේශපාලන මට්ටමේ සංවිධානවල නිලතල දැරීම සම්බන්ධයෙන් ලකුණු ලබාදෙනු නොලැබේ. උදාහරණ වශයෙන් ප්‍රාදේශීය සභා/නගර සභා මන්ත්‍රීවරුන්, සමුපකාර සමිති අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන් වැනි දේශපාලන පක්ෂ නියෝජනයෙන් ලබාගන්නා තනතුරු දැක්විය හැකි ය.

(iii) මාස තුනක් වන පුහුණු පාඨමාලාව දිස්ත්‍රික් ලේකම්ගේ අධීක්ෂණය යටතේ පවත්වන අතර එම පුහුණු පාඨමාලාව සාර්ථකව නිම කරන ලද බවට දිස්ත්‍රික් ලේකම් විසින් නිර්දේශ කරන අය මවිසින් ග්‍රාම නිලධාරි III වැනි ශ්‍රේණියට පත්කරනු ලැබේ. පුහුණු කාලය සඳහා රු. 3000 ක දීමනාවක් පමණක් ගෙවනු ලබන අතර එම කාලය තුළ නිවාඩු හිමිකම් නොමැත. පාඨමාලාව පැවැත්වෙන දින ගණනින් 80% අවම වශයෙන් සහභාගි විය යුතු ය. පුහුණු වැඩසටහන යටතේ පැවැත්වෙන ලිඛිත පරීක්ෂණයෙන් සමත්වීම සඳහා 50% ලකුණු ලබාගත යුතු ය. පුහුණු කාලය සේවා කාලයට ගණනය කරනු නොලබන අතර එම කාලය විශ්‍රාම වැටුප් ව්‍යවස්ථාවේ විධිවිධානවලට යටත්ව විශ්‍රාම වැටුප් ගණනය සඳහා පමණක් අදාළ කරගනු ඇත.

(iv) පුරප්පාඩුවක් හෝ පුරප්පාඩු කිහිපයක් සඳහා සමාන ලකුණු ලබා ඇති අයදුම්කරුවන් එක් අයකුට වඩා වැඩි සංඛ්‍යාවක් ඇති අවස්ථාවක එම පුරප්පාඩුව හෝ පුරප්පාඩු කිහිපය හෝ පිරවීම පිළිබඳව මවිසින් තීරණය කරනු ලැබේ.

06. *අයදුම්කරුවන්ට අවශ්‍ය සුදුසුකම් :* අපේක්ෂකයින් අවම වශයෙන් පහත දැක්වෙන සුදුසුකම් අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට හෝ ඊට පෙර සම්පූර්ණ කර තිබිය යුතු ය.

6.1 අයදුම්පත් භාරගන්නා අවසන් දිනට පූර්වාසන්න වර්ෂ හයක (06) කාල සීමාවක් ඇතුළත අපේක්ෂකයා තමා තනතුරට පත්වීමට බලාපොරොත්තුවන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ අවම වශයෙන් වර්ෂ තුනක් අඛණ්ඩව ස්ථිරව පදිංචිව සිටිය යුතු අතර එය—

1. ඡන්ද හිමි නාමලේඛනයේ උධෘත; හෝ
2. ප්‍රාදේශීය ලේකම් විසින් අනු අත්සන් කරන ලද ග්‍රාම නිලධාරි සහතිකයක් මඟින් සනාථ කළ යුතු ය.

6.2 *වයස් සීමාව.*—අයදුම්කරු අයදුම්පත් භාරගන්නා අවසන් දිනට වයස අවුරුදු 21ට නොඅඩු සහ 30ට නොවැඩි අයකු විය යුතු ය.

6.3 *අධ්‍යාපන සුදුසුකම්.*—අයදුම්කරුවන්ට පහත සඳහන් පරිදි අධ්‍යාපන සුදුසුකම් තිබිය යුතු ය :-

(අ) පළමු භාෂාව ලෙස සිංහල හෝ දෙමළ භාෂා අතරින් එක් භාෂා විෂයයක් හා ගණිතය ඇතුලුව අවම වශයෙන් විෂයයන් හතරකට සම්මාන හතරක් සමග විෂයයන් හයකින් (06) එක් වරක දී අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත්වීම; හෝ

(ආ) පළමු භාෂාව ලෙස සිංහල හෝ දෙමළ භාෂා අතරින් එක් භාෂා විෂයයක් හා ගණිතය ඇතුලුව අවම වශයෙන් බී ශ්‍රේණියේ සාමාර්ථයන් හතරක් සහිතව එක් වරක දී විෂයයන් හයකින් ජාතික පොදු අධ්‍යාපන සහතික පත්‍ර විභාගය සමත්වීම;

හෝ

(ඇ) පළමු භාෂාව ලෙස සිංහල හෝ දෙමළ භාෂාව අතුරින් එක් භාෂාවක් හා අංක ගණිතය හෝ වාණිජ අංක ගණිතය හෝ මූලික ගණිතය හෝ ශුද්ධ ගණිතය යන විෂයයන් අතුරින් එක් ගණිත විෂයයක් ද ඇතුලුව අවම වශයෙන් විෂයයන් හතරකට සම්මාන සහිතව විෂයයන් හයකින් (06) එක් වරක දී අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) පැරණි නිර්දේශය යටතේ විභාගය සමත්වීම; සහ

(ඈ) අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේ දී සියලුම විෂයයන්ගෙන් (සාමාන්‍ය පොදු පරීක්ෂණය හා ඉංග්‍රීසි භාෂා පරීක්ෂණය හැර) එකවර සමත්වීම. පැරණි විෂය නිර්දේශය යටතේ විෂයයන් තුනකින් (03) එකවර සමත්වීම ප්‍රමාණවත් වේ.

6.4 අපේක්ෂකයින්—

1. උපතින් හෝ ලියාපදිංචියෙන් ශ්‍රී ලාංකික පුරවැසියෙක් විය යුතු ය;
2. සාපරාධී ක්‍රියාවන් සම්බන්ධව අධිකරණයේ වරදකරු කරනු ලැබූ අයකු නොවිය යුතු අතර ඉතා හොඳ චරිතයකින් යුත් අයකු විය යුතු ය;
3. රජයේ හෝ රජයේ සංස්ථාවක හෝ රජයේ ව්‍යවස්ථාපිත ආයතනයක සේවයෙන් පහකළ අයකු, සේවය හැරගිය අයකු හෝ අකාර්යක්ෂමතාව මත විශ්‍රාම ගැන් වූ අයකු හෝ නොවිය යුතු ය;
4. වස්තු භංගත්වයට පත් වී ඇති තැනැත්තකු නොවිය යුතු ය.
5. යම් ආගමක හෝ ආගමික නිකායක පැවිදි වරයක් දරන තැනැත්තකු නොවිය යුතු ය.

07. තනතුරට අදාළ මාසික වැටුප් ක්‍රමය :
*වැටුප් පරිමාණය :-* රු. 13,990-10x145-11x170-6x240-14x320-රු. 23,230.

08. *සේවා කොන්දේසි :*

8.1 බඳවා ගැනීම සිදු කරනු ලබන්නේ ග්‍රාම නිලධාරි සේවයේ III වැනි ශ්‍රේණියට ය.

8.2 තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිත වේ. වැන්දඹු අනත්දරු/පුරුෂ අරමුදල සඳහා දායක විය යුතු ය. මාස 03ක පුහුණු කාලය ග්‍රාම නිලධාරි සේවා කාලයට ගණන් ගනු නොලැබේ.

8.3 මුල් පත්වීම් දින සිට වසර තුනක් පත්කරනු ලබන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ අනිවාර්යයෙන් සේවය කළ යුතු ය.

8.4 සතියට එක් විවේක දිනයක් හිමි අතර එම දිනය හැර සතියේ අනෙක් දිනයන්හි පැය 24 තුළ රාජකාරි සඳහා පත්කරනු ලබන ග්‍රාම නිලධාරි කොට්ඨාසය තුළ රාජකාරි ඉටු කිරීම සඳහා බැඳී සිටී.

8.5 මෙම තනතුර සඳහා පත්වන අයකු අනුමත බඳවා ගැනීම් පටිපාටියේ, රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යය සංග්‍රහයේ,

ආයතන සංග්‍රහයේ හා මුදල් රෙගුලාසිවල සඳහන් විධිවිධාන රෙගුලාසිවලට ද රජය විසින් පනවන ලද හා ඉදිරියේ දී පනවනු ලබන රෙගුලාසි හා විධිවිධානවලට ද යටත් වේ.

09. *අයැදුම්පත් එවිය යුතු ආකාරය* :

9.1 ආදර්ශ ආකෘතියට අනුව සකස් කරන ලද අයැදුම් පත්‍ර 2012.11.02 දිනට හෝ ඊට පෙර විභාග කොමසාරිස් ජනරාල්, සංවිධාන හා විදේශ විභාග ශාඛාව, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව, පැලවත්ත, බත්තරමුල්ල යන ලිපිනයට ලේඛනගත තැපෑලෙන් එවිය යුතු ය. අයැදුම්පත් බහාලූ කවරයේ වම් ඉහළ කෙළවර "ග්‍රාම නිලධාරි III වැනි ශ්‍රේණියට බඳවා ගැනීම සඳහා වන තරග විභාගය 2012" යනුවෙන් සඳහන් කළ යුතු ය.

9.2 අයැදුම්පත්‍රය, ආදර්ශ අයැදුම් පත්‍රය අනුව ඒ-4 ප්‍රමාණයේ කඩදාසියක ශීර්ෂ අංක 08 දක්වා මුල් පිටුවේ ද ඉතිරිය අනෙක් පිටුවලට ද ඇතුළත් වන පරිදි මුද්‍රණය කර හෝ යතුරු ලියනය කර අපේක්ෂකයාගේ අත් අකුරෙන් සම්පූර්ණ කළ යුතු ය.

9.3 අයැදුම්පත්‍රයේ අයදුම්කරුගේ අත්සන රජයේ විදුහලක විදුහල්පතිවරයෙකු හෝ සාමදාන විනිශ්චයකාරවරයෙකු හෝ දිවුරුම් කොමසාරිස්වරයෙකු හෝ නීතිඥවරයෙකු හෝ ත්‍රිවිධ හමුදාවේ අධිකාරි බලයලත් නිලධාරියෙකු හෝ පොලිස් සේවයේ *ගැසට්* කරන ලද තනතුරක් දරන නිලධාරියකු හෝ රාජ්‍ය සේවයේ ස්ථිර මාණ්ඩලික ශ්‍රේණියේ තනතුරක් දරන නිලධාරියකු හෝ විසින් සහතික කළ යුතු ය.

9.4 දැනටමත් රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් සිය අයදුම්පත්‍ර තම දෙපාර්තමේන්තු ප්‍රධානියා මඟින් එවිය යුතු ය.

9.5 විභාග ගාස්තු වශයෙන් රු. 500 ක මුදලක් අයකරනු ලැබේ. අයැදුම්කරුගේ නමින් මෙම විභාගයට අදාළව පමණක් එම මුදල ඕනෑම තැපැල් කාර්යාලයකට, දිස්ත්‍රික් ලේකම් කාර්යාලයකට හෝ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකට විභාග කොමසාරිස් ජනරාල්ගේ ආදායම් ශීර්ෂ අංක 2003-02-13 ට බැර කර ලබා ගන්නා ලද කුවිතාන්සිය විභාග අයැදුම්පත්‍රයට අමුණා තිබිය යුතු ය. (කුවිතාන්සි අංකය, දිනය හා තැපැල් කාර්යාලය/දිස්ත්‍රික් ලේකම් කාර්යාලය/ප්‍රාදේශීය ලේකම් කාර්යාලය පැහැදිලිව සඳහන් කර තිබිය යුතු ය.) ගෙවන ලද විභාග ගාස්තු මොනයම් හේතුවක් නිසාවත් ආපසු නොගෙවනු ලබන අතර, මෙම විභාග ගාස්තු කිසියම් විභාගයකට මාරු කිරීමට ද සලකා බලනු නොලැබේ. කුවිතාන්සියේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.

9.6 අසම්පූර්ණ හා අවිධිමත් අයදුම්පත්‍ර කිසිම දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. උදාහරණ වශයෙන් 9.2 ඡේදයේ සඳහන් ආකාරයට අනනුකූලව අයදුම්පත්‍රය සකස් කිරීම, කියවීමට අපහසු ආකාරයට අපැහැදිලි ලෙස අයදුම්පත්‍රය සම්පූර්ණ කිරීම, පත්වීම අපේක්ෂා කරන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය හා අංකය නිවැරදිව ඇතුළත් නොකිරීම, අයදුම්කරු අත්සන් කර නොතිබීම, විභාග ගාස්තු ගෙවන ලද කුවිතාන්සිය අලවා නොතිබීම ආදී කරුණු දැක්විය හැකි ය.

10. විභාගයට පෙනී සිටින අයැදුම්කරුවන් විභාග මධ්‍යස්ථානයේ දී තම අනන්‍යතාව ඔප්පු කළ යුතු අතර ඒ සඳහා පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කළ ජාතික හැඳුනුම්පත හෝ වලංගු විදේශ ගමන් බලපත්‍රය පමණක් පිළිගැනේ.

11. සියලුම විභාග අපේක්ෂකයින් *රජයේ ගැසට් පත්‍රයේ* පළකරන විභාග නීතිරීති පිළිබඳව අවබෝධයක් ලබා සිටිය යුතු අතර, ඒවා පිළිපැදීමට බැඳී සිටිය යුතු ය. විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට විභාග අපේක්ෂකයින් යටත් වේ. එම නීතිරීති උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත්වීමට අපේක්ෂකයින්ට සිදු වේ.

12. අපේක්ෂකයකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත් වීමට සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැලකෙන අතර අයැදුම්පත්‍රය වැරදි සහගතව හා අසම්පූර්ණව ඉදිරිපත් කර යම්කිසි අවාසියක් වෙතොත් අපේක්ෂකයා විසින්ම එය විඳ දරාගත යුතුය. එවැනි කරුණු සම්බන්ධ කිසිදු ඉල්ලීමක් සලකා බලනු නොලැබේ.

13. බඳවා ගැනීම් සිදු කරනු ලබන්නේ කිනම් දිනකට අදාළව පවතින පුරප්පාඩු සංඛ්‍යාව මත ද යන්න මවිසින් තීරණය කරනු ලබන අතර, එසේ තීරණය කරනු ලබන දිනය වන විට වාර්ෂික ස්ථාන මාරු කිරීම් හේතුවෙන් 1 වැනි උපලේඛනයේ සඳහන් සමහර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල පුරප්පාඩු සම්පූර්ණ වී තිබීමට ඉඩ ඇති බව අපේක්ෂකයින්ගේ අවධානයට ලක්කරනු ලැබේ. එවැනි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවලින් ඉදිරිපත් වන අපේක්ෂකයින් වෙනත් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයක පවතින පුරප්පාඩු සඳහා සුදුසුකම් ලැබීමට හිමිකම් නොලබන බව ද අවධාරණය කරනු ලැබේ.

14. විභාගය සඳහා ඉල්ලුම් කරනු ලබන, නියමිත විභාග ගාස්තු ගෙවා ඇති සියලුම අයැදුම්කරුවන්ට අයැදුම්කරු අයැදුම්පතේ සඳහන් කර ඇති මූලික සුදුසුකම් පරීක්ෂා කිරීමකින් තොරව විභාගයට පෙනී සිටීමට විභාග කොමසාරිස් ජනරාල් විසින් අවස්ථාව ලබාදෙන අතර මූලික සුදුසුකම් නොමැති බව සම්මුඛ පරීක්ෂණයේ දී හෝ පසු අවස්ථාවක දී හෝ අනාවරණය වුවහොත් විභාගයේ ප්‍රතිඵල මෙම තනතුර ලබා ගැනීම සඳහා සුදුසුකමක් ලෙස සලකනු නොලැබේ. අයැදුම්කරුවන් වෙත ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් පුවත්පත් නිවේදනයක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් පළ කරනු ඇත. නිවේදනය පළවී දින 3ක් පමණ ගත වූ පසුවත් ප්‍රවේශ පත්‍රය නොලැබුණි නම් දැන්වීමේ සඳහන් ආකාරයට ඒ බව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත දන්වා සිටිය යුතු ය. ඔබ වෙත තබාගත් අයදුම්පත්‍රයේ හා මුදල් ගෙවූ කුවිතාන්සියේ සහතික කළ ඡායා පිටපත් ද, ලියාපදිංචි කළ කුවිතාන්සිය ද, කොළඹින් බැහැර ප්‍රදේශයක නම් ප්‍රවේශපත්‍රය එවීම සඳහා ෆැක්ස් අංකයක් ද සඳහන් ඔබගේ ඉල්ලීම් ලිපිය ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත එවීම වඩාත් ඵලදායී වනු ඇත.

15. මෙම *ගැසට් නිවේදනයේ* සිංහල, දෙමළ, ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතු ය.

පී. බී. අබේකෝන්,
ලේකම්,
රාජ්‍ය පරිපාලන හා
ස්වදේශ කටයුතු අමාත්‍යාංශය.

කොළඹ 07, නිදහස් චතුරශ්‍රය,
රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය.

ආදර්ශ අයදුම් පත්‍රය

[ ]
(කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා පමණි.)

ග්‍රාම නිලධාරි සේවයේ III වැනි ශ්‍රේණියට බඳවා ගැනීමේ තරග විභාගය - 2012

01. පත්වීම සඳහා අයැදුම් කරනු ලබන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ නම සහ අංකය
නම :———————. අංකය [ | | | ]

(උපලේඛන I හි සඳහන් පරිදි අදාල වන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ නම හා අංකය නිවැරදිව සඳහන් කළ යුතුය. එය පසු අවස්ථාවකදී වෙනස් කිරීමට ඉඩදෙනු නොලැබේ.)

02. පත්වීම සඳහා අයැදුම් කරනු ලබන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය අයත් දිස්ත්‍රික්කයේ නම සහ අංකය : නම :———————.
අංකය :———————. [ | ]

(උපලේඛන I හි සඳහන් පරිදි අදාල වන දිස්ත්‍රික්කයේ නම සහ අංකය නිවැරදිව සඳහන් කළ යුතුය.)

03. විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය :
සිංහල - 2
දෙමළ - 3 භාෂා මාධ්‍යය [ ] අංකය [ ]
ඉංග්‍රිසි - 4
(අදාල භාෂා මාධ්‍යය හා අංකය කොටු තුළ ලියන්න. මෙය පසුව වෙනස් කිරීමට ඉඩදෙනු නොලැබේ.)

04. 4.1 අයැදුම්කරුගේ මුලකුරු සමග නම :———————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්, මුලකුරු අගට යොදන්න)
උදාහරණ : SILVA, A. B.

4.2 සම්පූර්ණ නම :———————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

4.3 සම්පූර්ණ නම :———————.
(සිංහලෙන්/දෙමළෙන්)

05. 5.1 ස්ථිර ලිපිනය :———————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරින්)

5.2 ස්ථිර ලිපිනය :———————.
(සිංහලෙන්/දෙමළෙන්)

06. ස්ත්‍රී/පුරුෂ භාවය : පුරුෂ 0 / ස්ත්‍රී 1 [ ] (අදාළ අංකය කොටුව තුල ලියන්න.)

07. ඔබ ශ්‍රී ලාංකික පුරවැසියකු වන්නේ :
පරම්පරාවෙන් - 1
ලියාපදිංචිවීමෙන් - 2 [ ] (අදාළ අංකය කොටුව තුල ලියන්න.)

08. 8.1 ජාතික හැඳුනුම්පත් අංකය : [ | | | | | | | | | ]

8.2 උපන්දිනය : වර්ෂය [ | | | ] මාසය [ | ] දිනය [ | ]

8.3 2012.11.02 වැනි දිනට වයස : අවුරුදු [ | ] මාස [ | ] දින [ | ]

09. ස්ථිර පදිංචි ග්‍රාම නිලධාරී කොට්ඨාසය හා අංකය : [ | | | ]

10. අධ්‍යාපන සුදුසුකම් :

10.1 අ. පො. ස. (සා.පෙ.)/ජා.පො.අ.ස. විභාගය හෝ සුදුසුකම් ලැබූ විභාගයේ විස්තර :
විභාගයේ නම :———————.
වර්ෂය :———————. විභාග අංකය :———————.

| විෂයය | ශ්‍රේණිය | විෂයය | ශ්‍රේණිය |
|---|---|---|---|
| 1. | | 5. | |
| 2. | | 6. | |
| 3. | | 7. | |
| 4. | | 8. | |

10.2 අ. පො. ස. (උ.පෙ.) සුදුසුකම් ලැබූ විභාගයේ විස්තර :

වර්ෂය :———————. විභාග අංකය :———————.

| විෂයය | ශ්‍රේණිය |
|---|---|
| 1. | |
| 2. | |
| 3. | |
| 4. | |

11. වෙනත් සුදුසුකම් :———————.

12. ඔබට විරුද්ධව මීට පෙර කවර හෝ චෝදනාවක් සම්බන්ධව අධිකරණය ඉදිරියේ නඩු පැවරීමක් හෝ උසාවියකින් වරදකරු වී ඇති අයෙක් ද යන වග : ඔව්/නැත

ඔව් නම් (i) උසාවිය හා නඩු අංකය :———————.
(ii) චෝදනාව :———————.
(iii) අධිකරණ තීන්දුව/දඬුවම :———————.

13. ඔබ මීට පෙර රජයේ හෝ පළාත් සභාවක හෝ සංස්ථාවක හෝ අධිකාරියක හෝ රජයට අනුබද්ධ ආයතනයක හෝ සේවය කර විනය හේතුවක් මත සේවයෙන් පහකර ඇත්තාවූ හෝ අකාර්යක්ෂමතාව මත විශ්‍රාම ගැන්වූ හෝ සේවය හැර ගියාවූ තැනැත්තෙක් ද යන වග : ඔව්/නැත (ඔව් නම් විස්තර සඳහන් කරන්න.)

14. අයැදුම්කරුගේ සහතිකය :

(අ) මෙම අයැදුම්පතෙහි මා විසින් සපයා ඇති තොරතුරු මා දන්නා තරමින් සත්‍ය හා නිවැරදි බව ගෞරවයෙන් ප්‍රකාශ කර සිටිමි.

(ආ) මෙම අයැදුම්පත හැරුණු විට මෙම විභාගය සඳහා මෙම ගැසට් නිවේදනය අනුව වෙනත් අයැදුම්පතක් මා විසින් ඉදිරිපත් කර නොමැති බව අවංකව ප්‍රකාශ කර සිටිමි.

(ඇ) විභාග ගාස්තු වශයෙන් රුපියල් ......... ගෙවන ලදී. ලදුපත් අංකය ......... ගෙවූ දිස්ත්‍රික් ලේකම්/ප්‍රාදේශීය ලේකම්/තැපැල් කාර්යාලය ............ දිනය ............

(ලදුපත නොගැලවෙන සේ මෙහි අලවන්න.)

(ඉ) විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට සහ ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් ගනු ලබන තීරණ වලට මම යටත්වන බව ප්‍රකාශ කරමි.

(ඊ) මා විසින් ඉහත සඳහන් කර ඇති තොරතුරු හා කරනු ලැබ ඇති ප්‍රකාශය මා සේවයට බඳවා ගැනීමට පෙර අසත්‍ය බැව් ඔප්පු වුවහොත් මෙම තනතුරට නුසුදුස්සකු වන බව හා එම තනතුරට පත්වීම් ලැබීමෙන් පසු එසේ ඔප්පු වුවහොත් සේවය අවසන් කිරීමට හෝ සේවයෙන් පහ කරනු ලැබීමට හෝ යටත්වන බව මම දැන සිටිමි.

————,
අයැදුම්කරුගේ අත්සන.

දිනය :————.

15. අයැදුම්කරුගේ අත්සන සහතික කිරීම ：

මෙම ඉල්ලුම් පත්‍රය ඉදිරිපත් කරන .................. මයා/මිය/මෙනවිය මා පෞද්ගලිකව හඳුනන බවත්, ඔහු/ඇය 2012/....../...... දින මා ඉදිරිපිට දී, මෙම ඉල්ලුම් පත්‍රය අත්සන් කළ බව ද, මෙයින් සහතික කරමි.

————,
සහතික කරන්නාගේ අත්සන.

නම :————.
පදවි නාමය :————.
දිනය :————.
(නිල මුද්‍රාව යොදන්න)

16. දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් ඉදිරිපත් කරනු ලබන අයැදුම්පත් සඳහා ：

මෙම අයැදුම් පත්‍රය ඉදිරිපත් කරන ................................ මයා/මිය/මෙනවිය අමාත්‍යාංශයේ/දෙපාර්තමේන්තුවේ ............ දින සිට .............. තනතුරෙහි සේවය කරන බවත්, ඔහුගේ/ඇයගේ සේවය සතුටුදායක බවත්, ඉහත සඳහන් කර ඇති තොරතුරු සත්‍ය බවත් සහතික කරමි. තවද ඔහු/ඇය මෙම තනතුරට තෝරා ගතහොත් වත්මන් තනතුරේ සේවයෙන් නිදහස් කළ හැකි/නොහැකි බවත් ප්‍රකාශ කර සිටිමි.

————,
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන.
(නිල මුද්‍රාව සහිතව)

දිනය :————.

උපලේඛනය I

| ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස අංකය | අයත් දිස්ත්‍රික්කය හා අංකය |
|---|---|---|
| කොළඹ | 1103 | |
| කොලොන්නාව | 1106 | |
| කඩුවෙල | 1109 | |
| හෝමාගම | 1112 | |
| හංවැල්ල | 1115 | |
| පාදුක්ක | 1118 | |
| මහරගම | 1121 | කොළඹ |
| ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ | 1124 | |
| තිඹිරිගස්යාය | 1127 | 0 1 |
| දෙහිවල | 1130 | |
| රත්මලාන | 1131 | |
| මොරටුව | 1133 | |
| කැස්බෑව | 1136 | |
| මීගමුව | 1203 | |
| කටාන | 1206 | |
| දිවුලපිටිය | 1209 | |
| මීරිගම | 1212 | |
| මිනුවන්ගොඩ | 1215 | |
| වත්තල | 1218 | ගම්පහ |
| ජාඇල | 1221 | |
| ගම්පහ | 1224 | 0 2 |
| අත්තනගල්ල | 1227 | |
| දොම්පෙ | 1230 | |
| මහර | 1233 | |
| කැලණිය | 1236 | |
| බියගම | 1239 | |
| පානදුර | 1303 | |
| බණ්ඩාරගම | 1306 | |
| හොරණ | 1309 | |
| ඉංගිරිය | 1310 | |
| බුලත්සිංහල | 1312 | |
| මදුරාවල | 1315 | කළුතර |
| මිල්ලනිය | 1318 | |
| කළුතර | 1321 | 0 3 |
| බේරුවල | 1324 | |
| දොඩන්ගොඩ | 1327 | |
| මතුගම | 1330 | |
| අගලවත්ත | 1333 | |
| පාලින්දනුවර | 1336 | |
| වලල්ලාවිට | 1339 | |
| තුම්පනේ | 2103 | |
| පූජාපිටිය | 2106 | |
| අකුරණ | 2109 | |
| පාතදුම්බර | 2112 | |
| පන්විල | 2115 | |
| උඩුදුම්බර | 2118 | |
| මිණිපේ | 2121 | මහනුවර |
| මැදදුම්බර | 2124 | |
| කුණ්ඩසාලේ | 2127 | 0 4 |
| ගඟවට කෝරළේ | 2130 | |
| හාරිස්පත්තුව | 2133 | |
| හතරලියද්ද | 2134 | |
| යටිනුවර | 2136 | |
| උඩුනුවර | 2139 | |
| දොළුව | 2142 | |

| ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස අංකය | අයත් දිස්ත්‍රික්කය හා අංකය |
|---|---|---|
| පාතහේවාහැට | 2145 | |
| දෙල්තොට | 2148 | |
| උඩපලාත | 2151 | |
| ගඟ ඉහළ කෝරලේ | 2154 | |
| පස්බාගේ කෝරලේ | 2157 | |
| ගලේවෙල | 2203 | |
| දඹුල්ල | 2206 | |
| නාඋල | 2209 | |
| පල්ලේපොල | 2212 | මාතලේ |
| යටවත්ත | 2215 | |
| මාතලේ | 2215 | 05 |
| අඹන්ගඟ කෝරළේ | 2221 | |
| ලග්ගල පල්ලේගම | 2224 | |
| විල්ගමුව | 2227 | |
| රත්තොට | 2230 | |
| උකුවෙල | 2233 | |
| කොත්මලේ | 2303 | |
| හඟුරන්කෙත | 2306 | නුවරඑළිය |
| වලපනේ | 2309 | |
| නුවරඑළිය | 2312 | 06 |
| අඹගමුව | 2315 | |
| බෙන්තොට | 3103 | |
| බලපිටිය | 3106 | |
| කරන්දෙණිය | 3109 | |
| ඇල්පිටිය | 3112 | |
| නියාගම | 3115 | |
| තවලම | 3118 | |
| නෙළුව | 3121 | |
| නාගොඩ | 3124 | |
| බද්දේගම | 3127 | ගාල්ල |
| වැලිවිටිය දිවිතුර | 3130 | |
| අම්බලන්ගොඩ | 3133 | 07 |
| හික්කඩුව | 3136 | |
| කඩවත් සතර | 3139 | |
| බෝපේ පෝද්දල | 3142 | |
| අක්මීමන | 3145 | |
| යක්කලමුල්ල | 3148 | |
| ඉමදූව | 3151 | |
| ගෝනපීනුවල | 3154 | |
| හබරාදූව | 3157 | |
| පිටබැද්දර | 3203 | |
| කොටපොල | 3206 | |
| පස්ගොඩ | 3209 | |
| මුලටියන | 3212 | |
| අතුරලිය | 3215 | මාතර |
| අකුරැස්ස | 3218 | |
| වැලිපිටිය | 3221 | 08 |
| මාලිම්බඩ | 3224 | |
| කඹුරුපිටිය | 3227 | |
| හක්මන | 3230 | |

| ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස අංකය | අයත් දිස්ත්‍රික්කය හා අංකය |
|---|---|---|
| කිරින්ද පුහුල්වැල්ල | 3233 | |
| තිහගොඩ | 3236 | |
| වැලිගම | 3239 | |
| මාතර | 3242 | |
| දෙවිනුවර | 3245 | |
| දික්වැල්ල | 3248 | |
| සූරියවැව | 3303 | |
| ලුණුගම්වෙහෙර | 3306 | |
| තිස්සමහාරාම | 3309 | |
| හම්බන්තොට | 3312 | |
| අම්බලන්තොට | 3315 | හම්බන්තොට |
| අගුණකොළපැලැස්ස | 3318 | |
| වීරකැටිය | 3321 | 09 |
| කටුවන | 3324 | |
| ඕකේවෙල | 3327 | |
| බෙලිඅත්ත | 3330 | |
| තංගල්ල | 3333 | |
| වලස්මුල්ල | 3336 | |
| කයිට්ස් (දිවයින උතුර) | 4103 | |
| චන්නාකෙයි (වලිකාමම් බටහිර) | 4106 | |
| සන්දිලිපායි (වලිකාමම් නිරිත) | 4109 | |
| තෙලිප්පලායි (වලිකාමම් උතුර) | 4112 | |
| උඩුවිල් (වලිකාමම් දකුණ) | 4115 | |
| කෝපායි (වලිකාමම් නැගෙනහිර) | 4118 | යාපනය |
| කරවෙඩ්ඩි (වඩමාරච්චි නිරිත) | 4121 | |
| මරුතන්කර්නි (වඩමාරච්චි නැගෙනහිර) | 4124 | 10 |
| පේද්‍රුරුතුඩුව (වඩමාරච්චි උතුර) | 4127 | |
| චාවකච්චේරි (තෙන්මරච්චි) | 4130 | |
| නල්ලූර් | 4133 | |
| වේලානායි (දිවයින දකුණ) | 4139 | |
| ඩෙල්ෆ් | 4142 | |
| කරෙයිනගර් | 4145 | |
| මන්නාරම | 4203 | |
| මාන්තායි බටහිර | 4206 | |
| මඩු | 4209 | මන්නාරම 11 |
| නානඩ්ඩාන් | 4212 | |
| මුසලි | 4215 | |
| වවුනියා උතුර | 4303 | |
| වවුනියා දකුණ | 4306 | වව්නියා |
| වවුනියා | 4309 | 12 |
| වෙන්ගලාචෙඩ්ඩිකුලම් | 4312 | |
| තුනුක්කායි | 4403 | |
| මාන්තායි නැගෙනහිර | 4406 | මුලතිව් |
| පුදුකුඩිරිප්පු | 4409 | 13 |
| ඔඩ්ඩුසුඩාන් | 4412 | |
| මැරිටයිම්පත්තු | 4415 | |
| වැලිඔය | 4418 | |

| ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස අංකය | අයත් දිස්ත්‍රික්කය හා අංකය |
|---|---|---|
| පච්චිලෙයිපල්ලි | 4503 | කිලිනොච්චි |
| කන්දවලායි | 4506 | |
| කරච්චි | 4509 | 14 |
| පූනාකරි | 4512 | |
| | | |
| කොරලේපත්තු උතුර | 5103 | |
| කෝරලේපත්තු බටහිර (ඔඩ්ඩමාවඩි) | 5106 | |
| කෝරලේපත්තු (වාලච්චේනෙයි) | 5109 | |
| එරාවූර්පත්තු | 5112 | |
| එරාවූර් නගරය | 5115 | |
| මන්මුනේ උතුර | 5118 | මඩකලපුව |
| මන්මුනේ බටහිර | 5121 | |
| කාත්තන්කුඩි | 5124 | 1 5 |
| මන්මුනේපත්තු | 5127 | |
| මන්මුනේ නිරිත | 5130 | |
| පෝරතිව්පත්තු | 5133 | |
| මන්මුනේ දකුණ | 5136 | |
| කෝරලේපත්තු දකුණ | 5139 | |
| කෝරලේපත්තු මධ්‍යම | 5142 | |
| | | |
| දෙහිඅත්තකණ්ඩිය | 5203 | |
| පදියතලාව | 5206 | |
| මහඔය | 5209 | |
| උහන | 5212 | |
| අම්පාර | 5215 | |
| නාවින්දවේලි | 5216 | |
| සමන්තුරෙයි | 5218 | |
| කල්මුණ-දෙමළ | 5224 | |
| සායින්දමරුදු | 5225 | අම්පාර |
| කාරතිව් | 5227 | |
| නින්දවූර් | 5230 | 1 6 |
| අඩ්ඩාලචේන | 5233 | |
| එරගම | 5234 | |
| අක්කරෙයිපත්තුව | 5236 | |
| අලයඩිවෙම්බු | 5239 | |
| දමන | 5242 | |
| තිරුක්කෝවිල් | 5245 | |
| පොතුවිල් | 5248 | |
| ලාහුගල | 5251 | |
| කල්මුණ-මුස්ලිම් | 5254 | |
| | | |
| පදවි ශ්‍රී පුර | 5303 | |
| කුච්චවේලි | 5206 | |
| ගෝමරන්කඩවල | 5309 | |
| මොරවැව | 5312 | |
| නගර හා කඩවත් | 5315 | ත්‍රිකුණාමලය |
| තඹලගමුව | 5318 | |
| කන්තලේ | 5321 | 1 7 |
| කින්නියා | 5324 | |
| මුතූර් | 5327 | |
| සේරුවිල | 5330 | |
| වෙරුගල්/ඊච්චලම්පත්තුව | 5333 | |

| ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස අංකය | අයත් දිස්ත්‍රික්කය හා අංකය |
|---|---|---|
| ගිරිබාව | 6103 | |
| ගල්ගමුව | 6106 | |
| ඇහැටුවැව | 6109 | |
| අඹන්පොල | 6112 | |
| කොටවෙහෙර | 6115 | |
| රස්නායකපුර | 6118 | |
| නිකවැරටිය | 6121 | |
| මහව | 6124 | |
| පොල්පිතිගම | 6127 | |
| ඉබ්බාගමුව | 6130 | |
| ගනේවත්ත | 6133 | |
| වාරියපොල | 6136 | |
| කොබෙයිගනේ | 6139 | |
| බිංගිරිය | 6142 | |
| බමුණාකොටුව | 6149 | කුරුණෑගල |
| මාස්පොත | 6151 | |
| කුරුණෑගල | 6154 | 18 |
| මල්ලවපිටිය | 6157 | |
| මාවතගම | 6160 | |
| රිදීගම | 6163 | |
| වීරඹුගෙදර | 6166 | |
| කුලියාපිටිය නැගෙනහිර | 6169 | |
| කුලියාපිටිය බටහිර | 6172 | |
| උඩුබද්දාව | 6175 | |
| පන්නල | 6178 | |
| නාරම්මල | 6181 | |
| අලව්ව | 6184 | |
| පොල්ගහවෙල | 6187 | |
| පඩුවස්නුවර නැගෙනහිර | 6190 | |
| පඩුවස්නුවර බටහිර | 6193 | |
| | | |
| කල්පිටිය | 6203 | |
| වනාතවිල්ලුව | 6206 | |
| කරුවලගස්වැව | 6209 | |
| නවගත්තේගම | 6212 | |
| පුත්තලම | 6215 | |
| මුන්දලම | 6218 | |
| මහකුඹුක්කඩවල | 6221 | පුත්තලම |
| ආණමඩුව | 6224 | |
| පල්ලම | 6227 | 1 9 |
| ආරච්චිකට්ටුව | 6230 | |
| හලාවත | 6233 | |
| මාදම්පෙ | 6236 | |
| මහවැව | 6239 | |
| නාත්තන්ඩිය | 6242 | |
| වෙන්නප්පුව | 6245 | |
| දංකොටුව | 6248 | |
| | | |
| පදවිය | 7103 | |
| කැබිතිගොල්ලෑව | 7106 | |
| මැදවච්චිය | 7109 | |
| මහවිලච්චිය | 7112 | අනුරාධපුරය |
| මධ්‍යම නුවරගම් පළාත | 7115 | |
| රඹෑව | 7118 | 20 |
| කහටගස්දිගිලිය | 7121 | |
| හොරොව්පතාන | 7124 | |
| ගලෙන්බිඳුනුවැව | 7127 | |

| ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස අංකය | අයත් දිස්ත්‍රික්කය හා අංකය |
|---|---|---|
| මිහින්තලේ | 7130 | |
| නැගෙනහිර නුවරගම් පළාත | 7133 | |
| නාච්චාදූව | 7136 | |
| නොච්චියාගම | 7139 | |
| රාජාංගනය | 7142 | |
| තඹුත්තේගම | 7145 | අනුරාධපුර |
| තලාව | 7148 | |
| තිරප්පනේ | 7151 | 20 |
| කැකිරාව | 7154 | |
| පලුගස්වැව | 7157 | |
| ඉපලෝගම | 7160 | |
| ගල්නෑව | 7163 | |
| පලාගල | 7166 | |
| හිඟුරක්ගොඩ | 7203 | |
| මැදිරිගිරිය | 7206 | |
| ලංකාපුර | 7209 | පොළොන්නරුව |
| වැලිකන්ද | 7210 | |
| දිඹුලාගල | 7220 | 21 |
| තමන්කඩුව | 7215 | |
| ඇලහැර | 7218 | |
| මහියංගනය | 8103 | |
| රිදීමාලියද්ද | 8106 | |
| මීගහකිවුල | 8109 | |
| කන්දකැටිය | 8112 | |
| සොරණාතොට | 8115 | |
| පස්සර | 8118 | බදුල්ල |
| ලුණුගල | 8119 | |
| බදුල්ල | 8121 | 22 |
| හාලිඇල | 8124 | |
| ඌව පරණගම | 8127 | |
| වැලිමඩ | 8130 | |
| බණ්ඩාරවෙල | 8133 | |
| ඇල්ල | 8136 | |
| හපුතලේ | 8139 | |
| හල්දුම්මුල්ල | 8142 | |

| ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස අංකය | අයත් දිස්ත්‍රික්කය හා අංකය |
|---|---|---|
| බිබිල | 8203 | |
| මඩුල්ල | 8206 | |
| මැදගම | 8209 | |
| සියඹලාණ්ඩුව | 8212 | |
| මොණරාගල | 8215 | මොණරාගල |
| බඩල්කුඹුර | 8218 | |
| බුත්තල | 8221 | 23 |
| වැල්ලවාය | 8224 | |
| කතරගම | 8227 | |
| තණමල්විල | 8230 | |
| සෙවනගල | 8233 | |
| ඇහැලියගොඩ | 9103 | |
| කුරුවිට | 9106 | |
| කිරිඇල්ල | 9109 | |
| රත්නපුර | 9112 | |
| ඉඹුල්පේ | 9115 | |
| බලංගොඩ | 9118 | |
| ඕපනායක | 9121 | රත්නපුර |
| පැල්මඩුල්ල | 9124 | |
| ඇලපාත | 9127 | 24 |
| අයගම | 9130 | |
| කලවාන | 9133 | |
| නිවිතිගල | 9136 | |
| කහවත්ත | 9139 | |
| ගොඩකවෙල | 9142 | |
| වැලිගෙපොල | 9145 | |
| ඇඹිලිපිටිය | 9148 | |
| කොලොන්න | 9151 | |
| රඹුක්කන | 9203 | |
| මාවනැල්ල | 9206 | |
| අරණායක | 9209 | |
| කෑගල්ල | 9212 | කෑගල්ල |
| ගලිගමුව | 9215 | |
| වරකාපොල | 9218 | 25 |
| රුවන්වැල්ල | 9221 | |
| බුලත්කොහුපිටිය | 9224 | |
| යටියන්තොට | 9227 | |
| දෙහිඕවිට | 9230 | |
| දැරණියගල | 9233 | |

10- 375

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරනු ලබන

## සංශෝධිත ගාස්තු

2009 ජනවාරි මස 01 වැනි දින සිට

(සෑම සිකුරාදා දිනයන්හි ගැසට් පත්‍රය පළ කරනු ලැබේ.)

1. සියලු ම දැන්වීම් සහ ප්‍රකාශනයන් පළ කරනු ලබන්නේ ප්‍රසිද්ධ කරන්නාගේ වගකීම පිටය.
2. පෞද්ගලික පළකරන්නන්ගේ සියලු ම දැන්වීම් සහ ප්‍රකාශන ඒ සඳහා නියමිත සම්පූර්ණ ගාස්තුවත් සමග කොළඹ 08, බොරැල්ල, ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණාලයාධිපතිට තැපෑලෙන් එවීමට හෝ ගෙනැවිත් භාරදීමට පුළුවන.
3. කාර්යාල වේලාවන් පෙරවරු 8.30 සිට පස්වරු 4.15 දක්වා වේ.
4. මුදල් ගනුදෙනු කරනු ලබන්නේ පෙරවරු 9.00 සිට පස්වරු 3.00 දක්වා බව සැලකිය යුතු යි.
5. සියලු ම දැන්වීම් සහ ප්‍රකාශන සඳහා ගාස්තුව කලින් ගෙවිය යුතුයි. දැන්වීම් සහ ප්‍රකාශනයන් තැපෑලෙන් එවන විට ඒ සමග ම අයවිය යුතු ගාස්තුව සඳහා මුදල් ඇනවුමක් හෝ චෙක් පතක් හෝ තැපැල් ඇනවුමක් රජයේ මුද්‍රණාලයාධිපතිට එවිය යුතු ය.
6. ප්‍රමාදය සහ දොස් වළක්වා ගැනීම සඳහා පළ කරන්නට නියමිත පිටපත කඩදාසියේ එක් පැත්තක පමණක් පැහැදිලි ව ටයිප් කර එවිය යුතු ය. **අත් අකුරින් ලියූ කිසිම නිවේදනයක් භාරගනු නොලැබේ.**
7. සෑම අත්සනකට ම යටින් අකුරු වෙන්කොට පැහැදිලිව අත්සනේ අකුරු ලිවිය යුතු යි.
8. වෙළඳ ප්‍රචාරක කටයුතු සඳහා දැන්වීම් හා රජයේ සේවයේ නොවන අයගේ නම් වෙනස් කිරීම පිළිබඳ කරන දැන්වීම් පළ කරනු නොලැබේ.
9. උසාවියේ අණපනත් යටතේ නිකුත් කළා යයි හැඟෙන ප්‍රකාශන, සුප්‍රීම් උසාවියේ නීතිඥවරයකුගේ අනුමැතිය හෝ අත්සන නොමැතිව ප්‍රසිද්ධ කරනු නොලැබේ.
10. **2009 ජනවාරි මස 01 වැනි දින සිට දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරන ගාස්තු මෙසේ යි :-**

| | රු. ශ. |
|---|---|
| අඟලකට හෝ ඉන් අඩුව ... ... ... ... | 137 00 |
| වැඩිවන සෑම අඟලකට හෝ ඉන් කොටසකට ... ... ... | 137 00 |
| තනි තීරුවකට හෝ ගැසට් පිටුවකින් අඩකට ... ... ... | 1,300 00 |
| තීරු දෙකකට හෝ සම්පූර්ණ ගැසට් පිටුවකට ... ... ... | 2,600 00 |

*(අඟලේ සෑම කොටසකට ම සම්පූර්ණ අඟලකට අය කරනු ලබන ගාස්තුව අය කරනු ලැබේ.)*

11. සෑම සිකුරාදා දිනකට ම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය පළ කරනු ලැබේ. ප්‍රසිද්ධ නිවාඩු දින අතරට පැමිණෙන සෑම සතියක දී ම පළ කරන දිනය වෙනස් වීමට ඉඩ තිබේ.
12. සෑම මාසයක ම මුල් සතියේ ගැසට් පත්‍රයේ සෑම කොටසක ම කෙලවරෙහි වෙනම පළවන දැන්වීමේ සඳහන් ප්‍රකාර, සියලු ම දැන්වීම් සහ ප්‍රකාශනයන් කොළඹ 08, රජයේ මුද්‍රණාලයේ මුද්‍රණාලයාධිපතිට ලැබෙන සේ එවිය යුතු යි.
13. **2009 ජනවාරි මස 01 වැනි දින සිට ක්‍රියාත්මකවන සංශෝධිත දායක ගාස්තුව :-**

### * ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය - (වාර්ෂික දායක මුදල සහ තැපැල් ගාස්තුව)

| | *වාර්ෂික දායක මුදල* *රු. ශ.* | *තැපැල් ගාස්තුව* *රු. ශ.* |
|---|---|---|
| I වැනි කොටස : | | |
| I වැනි ඡේදය ... ... ... ... ... ... ... | 2,080 00 | 3,120 00 |
| II වැනි ඡේදය (පළ කිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර් සහ විභාග ආදිය) ... ... | 1,300 00 | 3,120 00 |
| III වැනි ඡේදය ... ... ... ... ... ... ... | 780 00 | 3,120 00 |
| I වැනි කොටස සම්පූර්ණයෙන් (I, II සහ III ඡේද තුන ම ඇතුළත් ව) ... ... | 4,160 00 | 6,240 00 |
| II වැනි කොටස ... ... ... ... ... ... ... ... | 580 00 | 3,120 00 |
| III වැනි කොටස ... ... ... ... ... ... ... ... | 405 00 | 3,120 00 |
| IV වැනි කොටස (පළාත් පාලන දැන්වීම් සහ පළාත් සභා දැන්වීම්) ... ... ... | 890 00 | 2,400 00 |
| V වැනි කොටස ... ... ... ... ... ... ... ... | 860 00 | 420 00 |
| VI වැනි කොටස ... ... ... ... ... ... ... ... | 260 00 | 180 00 |
| අති විශෙෂ ගැසට් පත්‍රය... ... ... ... ... ... ... ... | 5,145 00 | 5,520 00 |

(ලිත් වර්ෂය අවසානයේ නිමවන සේ දායක ගාස්තු භාරගනුයේ දොලොස් මාසයකට නොඅඩු කාලසීමාවකට පමණ ය. )

### * තනි පිටපත් සඳහා ගාස්තු (පිටපත් විකිණීමට තිබේ නම්)

| | පිටපතක මිළ *රු. ශ.* | තැපැල් ගාස්තුව *රු. ශ.* |
|---|---|---|
| I වැනි කොටස : | | |
| I වැනි ඡේදය ... ... ... ... ... ... ... | 40 00 | 60 00 |
| II වැනි ඡේදය (පළ කිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර් සහ විභාග ආදිය) ... ... | 25 00 | 60 00 |
| III වැනි ඡේදය ... ... ... ... ... ... ... | 15 00 | 60 00 |
| I වැනි කොටස සම්පූර්ණයෙන් (I, II සහ III ඡේද තුන ම ඇතුළත් ව) ... ... | 80 00 | 120 00 |
| II වැනි කොටස ... ... ... ... ... ... ... ... | 12 00 | 60 00 |
| III වැනි කොටස ... ... ... ... ... ... ... ... | 12 00 | 60 00 |
| IV වැනි කොටස (පළාත් පාලන දැන්වීම් සහ පළාත් සභා දැන්වීම්) ... ... ... | 23 00 | 60 00 |
| V වැනි කොටස ... ... ... ... ... ... ... ... | 123 00 | 60 00 |
| VI වැනි කොටස ... ... ... ... ... ... ... ... | 87 00 | 60 00 |

* කොළඹ 05, කිරුළපන, මායා මාවතේ, අංක 132 හි ප්‍රකාශන කාර්යංශයේ තනිපිටපත් විකිණීම සහ දායක මුදල් භාර ගැනීමේ අධිකාරී වෙත මුදල් ලැබෙන්නට සළස්වන්න.

# ගැසට් පත්‍රය පළ කිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* සාමාන්‍යයෙන් සිකුරාදා දිනවල පළ කරනු ලැබේ. සිකුරාදා දිනයක් රජයේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාදා දිනට ප්‍රථම වැඩ කරන දිනයේ *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ. ඒ අනුව *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා නිවේදන භාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය සහ වේලාවන් පහත පළ කර ඇති උපලේඛනයේ දැක්වේ. පහත සඳහන් නියමිත වේලාවට පසු ලැබෙනන සියළුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ *ගැසට් පත්‍රයේ* එය පළ කළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් වුවමනා *ගැසට් පත්‍රයට* දැන්වීම ඇතුළත් වෙනවාත් හැර එය සියලු දෙනාගේ ම පහසුවට ද හේතු වන බව සළකන්න.

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය මිල දී ගැනීම සඳහා රජයේ මුද්‍රණාලයාධිපති දායක මුදල් භාර නොගනී. සියලු ම දායක මුදල් කොළඹ 05, කිරුළපන, මායා මාවතේ අංක 132 හි පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත කෙළින් ම ගෙවිය යුතුය.**

***සැළකිය යුතුයි.*** - මුදල් ගෙවා *ගැසට් පත්‍රයේ* පළ කරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු මුදල් රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත නොව රජයේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සළකන්න.

## උපලේඛනය

| *මාසය* | *පළ කිරීමේ දිනය* | | *ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය හා වේලාව* | | | |
|---|---|---|---|---|---|---|
| | | | **2012** | | | |
| ඔක්තෝබර් | 2012.10.05 | සිකුරාදා | 2012.09.21 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2012.10.12 | සිකුරාදා | 2012.09.28 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2012.10.19 | සිකුරාදා | 2012.10.05 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2012.10.25 | බ්‍රහස්පතින්දා | 2012.10.12 | සිකුරාදා | දහවල් | 12.00 |
| නොවැම්බර් | 2012.11.02 | සිකුරාදා | 2012.10.19 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2012.11.09 | සිකුරාදා | 2012.10.25 | බ්‍රහස්පතින්දා | දහවල් | 12.00 |
| | 2012.11.16 | සිකුරාදා | 2012.11.02 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2012.11.23 | සිකුරාදා | 2012.11.09 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2012.11.30 | සිකුරාදා | 2012.11.16 | සිකුරාදා | දහවල් | 12.00 |
| දෙසැම්බර් | 2012.12.07 | සිකුරාදා | 2012.11.23 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2012.12.14 | සිකුරාදා | 2012.11.30 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2012.12.21 | සිකුරාදා | 2012.12.07 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2012.12.28 | සිකුරාදා | 2012.12.14 | සිකුරාදා | දහවල් | 12.00 |

**බී. කේ. එස්. රවීන්ද්‍ර,**
රජයේ මුද්‍රණාලයාධිපති. *(වැ. බ.)*

2012 ජුනි මස 23 වැනි දින,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.